cepa
centre for poverty analysis



# යුද්ධයත් සමග ම වැඩීම

## ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ සන්නද්ධ අරගලයෙන් පීඩාවට පත් ළමුන්ගේ අත්දැකීම්

සරා විමලධර්ම
අමරසිරි ද සිල්වා
නිලක්ෂි ද සිල්වා

2006 සැප්තැම්බර්

කාර්යපත්‍රිකා මාලාව අංක 11 - 2006

# යුද්ධයත් සමඟ ම වැඩීම

## ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ සන්නද්ධ අරගලයෙන් පීඩාවට පත් ළමුන්ගේ අත්දැකීම්

**සරා විමලධර්ම**
**අමරසිරි ද සිල්වා**
**නිලක්ෂි ද සිල්වා**

2006 සැප්තැම්බර්

කාර්යපත්‍රිකා මාලාව අංක 11 - 2006

යුද්ධයත් සමඟ ම වැඩීම: ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ සන්නද්ධ අරගලයෙන් පීඩාවට පත් ළමුන්ගේ අත්දැකීම්

© දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය 2006

ප්‍රථම මුද්‍රණය - 2006

ISBN: 955-1040-31-7

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

විමලධර්ම, සරා

යුද්ධයත් සමඟ ම වැඩීම: ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ සන්නද්ධ අරගලයෙන් පීඩාවට පත් ළමුන්ගේ අත්දැකීම් - Growing up with war: experiences of children affected by armed conflict in the eastern province in Sri Lanka / සරා විමලධර්ම, අමරසිරි ද සිල්වා, නිලක්ෂි ද සිල්වා විසිනි. කොළඹ: දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය, 2006 (කාර්ය පත්‍රිකා මාලාව අංක 11), පි. 34: රූපසටහන්, සෙ.මී. 29.

ISBN: 955-1040-31-7 මිල: රු. 300.00

i. 3036 ඩීවී 21 ii. ග්‍රන්ථ නාමය

iii. ද. සිල්වා, අමරසිරි (සම කර්තෘ) iv. ද. සිල්වා, නිලක්ෂි - සම කර්තෘ

1. ගැටුම් හා ගැටුම් නිරාකරණය

පිටකවර නිර්මාණය: සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ

මුද්‍රණය: සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ
67, කාර්මික ජනපදය
කටුවාන පාර
හෝමාගම
ශ්‍රී ලංකාව

ප්‍රකාශනය: දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ ප්‍රකාශන මාලාවට දනට ඇතුළත්ව ඇත්තේ පහත දක්වෙන ගණයන් ය: අධ්‍යයනයන්, සංස්කරණිත වෙළුම්, කාර්යපත්‍රිකා සහ ලුහුඬින් කරුණු දක්වීමේ පත්‍රිකා ආදියයි.

**සරා විමලධර්ම,** දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ වෘත්තිකයෙකි. ප්‍රචණ්ඩත්වය, ගැටුම් සහ සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරිනියක වන ඇය ලන්ඩන් විශ්වවිද්‍යාලයේ ප්‍රාචීන සහ අප්‍රිකානු අධ්‍යයනයන් පිළිබඳ පාසලින් (SOAS) සංවර්ධන අධ්‍යයනයන් සහ නීතිය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය ලබා සිටී.

**අමරසිරි ද සිල්වා,** ශ්‍රී ලංකාවේ පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අංශයේ මහාචාර්යවරයෙක් වන අතර 2002 - 2004 කාලසීමාව තුළ අංශ ප්‍රධානියා වශයෙන් කටයුතු කර තිබේ. ඇමෙරිකා එක්සත් ජනපදයේ පුහුණුව ලද (ආචාර්ය උපාධිය, කනෙක්ටිකට් සරසවිය) මානව විද්‍යාඥයෙක් වන ඔහු තායිලන්තයේ බැංකොක් හි තාක්ෂණවිද්‍යාව පිළිබඳ ආසියානු ආයතනයෙන් (AIT) ග්‍රාමීය සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත.

**නිලක්ෂි ද සිල්වා,** දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ඨ වෘත්තිකයෙකි. ඇය ප්‍රින්ස්ටන් විශ්වවිද්‍යාලයේ මහජන සහ ජාත්‍යන්තර ප්‍රතිපත්තිය පිළිබඳ වුඩ්රෝ විල්සන් පාසලින් ප්‍රතිපත්ති විශ්ලේෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද, ආර්ථික විද්‍යාව සහ දේශපාලනය පිළිබඳ ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ද ලබා ඇත.

**දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (දවිකේ)** දරිද්‍රතාවට අදාළ සංවර්ධන ගැටළු පිළිබඳ වෘත්තීයමය සේවාවන් සැපයීමේ අරමුණින් 2001 දී ස්ථාපිත කරන ලදී. ව්‍යාවහාරික පර්යේෂණ, උපදේශන සේවා, පුහුණුව සහ සංවාදය හා හුවමාරුව යන අංශයන්ට අදලව සංවර්ධන සංවිධානයන්ට සහ වෘත්තිකයන්ට අවශ්‍ය සේවාවන් සැපයීම සිදු කරයි. මෙම සේවාවන් පිළිබඳ ව දැනට ඒකරාශී වී ඇති කේන්ද්‍රීය වැඩසටහන් අතරට දරිද්‍රතාවයේ බලපෑම අධීක්ෂණාත්මක ව මෙහෙයවීම, දරිද්‍රතාව සහ ගැටුම සහ දරිද්‍රතා තක්සේරුව හා දැනුම් කළමනාකරණය ඇතුළත් වේ.

ශ්‍රී ලාංකේය සහසම්බන්ධතාවෙහි ලා දරිද්‍රතාව සහ ගැටුම අතර පවතින අන්තර්ක්‍රියාව වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම අරමුණු කරගත් "යුද්ධයත් සමඟම වැඩීම" නම් මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය දරිද්‍රතාව සහ ගැටුම පිළිබඳ වැඩසටහනේ නිපැයුමකි.

**ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ දෙපාර්තමේන්තුව (ජාසදෙ)** සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ දරිද්‍රතාව පහත හෙළීමේ වගකීම දරන්නාවූත්, දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයෙහි දරිද්‍රතාව සහ ගැටළු පිළිබඳ වැඩසටහනට දායකත්වය පිරිනමන්නාවූත් එක්සත් රාජධානියේ රජයට අයත් දෙපාර්තමේන්තුවකි. මෙහි සමස්ත අරමුණ වන්නේ විශේෂයෙන් ම සහස්‍රක සංවර්ධන ඉලක්ක (සසඉ) අත්පත් කර ගැනීම තුළින් ගෝලීය දරිද්‍රතාව පහත හෙළීම සහ ධරණීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමය. සහරානුබද අප්‍රිකාවේ සහ ආසියාවේ අන්ත දුගී රටවලට ආධාර සැපයීම සිය මූලික අරමුණ වුව ද, ලතින් ඇමෙරිකාවේ සහ නැගෙනහිර යුරෝපයේ මධ්‍යම මට්ටමේ ආදායම් ලබන රටවල දරිද්‍රතාව පහත හෙළීමට සහ ධරණීය සංවර්ධනය උදෙසා ද සිය දායකත්වය පිරි නමයි. සහස්‍රක සංවර්ධන ඉලක්ක මුදුන්පමුණුවා ගැනීම සඳහා කැපවුන රාජ්‍යයන්, සිවිල් සමාජ, පෞද්ගලික අංශය සහ පර්යේෂක ප්‍රජාව සමඟ එක් වී සිය කටයුතු හවුලේ සිදු කරයි.

# ස්තුති කිරීම

මෙම වාර්තාව සහයෝගීතා ප්‍රයත්නයක ප්‍රතිඵලයකි. මෙහි පර්යේෂණ සංකල්පය සහ එහි සැකැස්ම සම්බන්ධයෙන් වරුණි ගනේපොල සහ කාංචනා රුවන්පුර වෙතින් අගනා දායකත්වයක් පිරි නැමිණ. හේමන්ති දසනායක, නිරුබා පුෂ්පකුමාර සහ සත්‍යසෝබනා සත්‍යානන්දන් අධ්‍යයනයේ ආරම්භක අවස්ථාවන්හි දී ඊට උදව් කළහ. ගුණාත්මක ක්ෂේත්‍ර පර්යේෂණ සිදු කිරීම සඳහා ද උපකාරී වූ විගිතා රේංගනාදන්, ශකීලා ජබාර් සහ මොහමඩ් ෆාහිම් යන අයගේ ආධාරයෙන් සහ මාර්ගෝපදේශ ඔස්සේ එම්. මාලති, එස් අමුතාමනී, එස්. උෂානන්තිනී, ආර්, අමුතා, කේ. ජීවා, ඒ. එලන්ගේෂ්වරි, ටී. එච්. චමිලා නදීශානී, එම්. නිරංජලාදේවී, සහ වී. යශෝධිනී විසින් දිස්ත්‍රික්කයන් තුළ ගෘහවාසයන් පිළිබඳ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. ශකීලා ජබාර් සහ විගිතා රේංගනාදන් දත්ත විශ්ලේෂණය කිරීමෙන් මෙම වාර්තාව සම්පාදනය කිරීමට සහාය වූහ. මෙහි මුල් කෙටුම්පත් පිළිබඳව වරුණි ගනේපොල සහ ක්ලෝඩියා ඉබාගුවන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් දැක්වීම් ප්‍රයෝජනවත් විය. ඔවුන්ගේ සහාය සහ දවිකේහි සෙසු හිතවතුන්ගෙන් ලද උපකාරයන් ද කෘතඥතාපූර්වක ව සිහිපත් කරමු.

සිය නිවෙස්වල දී අප පිළිගැනීමෙන් ද, සුහදශීලී ලෙස ආගන්තුක සත්කාර දක්වීමෙන් ද, ඒ සියල්ලට වඩා වැදගත් ලෙස අප සමඟ තම අත්දැකීම් බෙදාහදා ගැනීමට ඉදිරිපත් වීමෙන් ද දක් වූ සහයෝගය සම්බන්ධයෙන් සම්මුඛ සාකච්ඡාවන්ට සහ සමීක්ෂණයන්ට සහභාගී වූ නැගෙනහිර පළාත්වාසී සියලු දෙනාට අපගේ ස්තුතිය පුද කරනු කැමැත්තෙමු. ඔවුන් වෙතින් දිස් වූ ධෛර්‍යමත්භාවය අධිෂ්ඨානය සහ මනුෂ්‍යත්වය ප්‍රශංෂණීය වූ අතර ඔවුන් හමුවීමට අවස්ථාවක් ලැබීම අපගේ භාග්‍යයක් කොට සලකමු.

# පටුන


**ස්තුති කිරීම** vi

**සාරාංශය** **1**

**1. හැඳින්වීම** **2**

**2. ක්‍රමවේදය සහ අධ්‍යයනයට අදාළ එළඹුම** **5**

**3. ගෘහවාසයන් ට ගැටුම/යුද්ධයෙන් ඇති වී තිබෙන බලපෑම්** **8**

3.1 නැගෙනහිර පළාත පිළිබඳ සමස්තාවලෝකනයක් 8

3.2 ගැටුම පිළිබඳ ගෘහවාසයන්හි සංජානනයන් 9

3.3 ගැටුම සහ දරිද්‍රතාව පිළිබඳ සංජානනය 10

**4. ළමුන් සහ සන්නද්ධ ගැටුම** **12**

4.1 ගැටුම සහ අධ්‍යාපනය 12

4.1.1 අධ්‍යාපන මට්ටම් සහ අධ්‍යාපනය හැර යන්නන් 12

4.1.2 අධ්‍යාපනයේ ගුණාත්මකභාවය 15

4.2 ගැටුම සහ ළමා කාර්‍යයන් 17

4.3 ගැටුම සහ සෞඛ්‍යය 19

4.4 ළමුන් සහ ඔවුන්ගේ ආධාරක පද්ධති 20

**5. ළමුන් තුළ පිහිටි සංජානනයන්** **23**

**6. නිගමනයන් සහ නිර්දේශයන්** **26**

**7. ඇමිණුම්** **31**

**ඇමිණුම** I: ශ්‍රී ලංකාවේ සිතියම **33**

**ඇමිණුම** II: සමීක්ෂණය සිදු කළ ගම්වල නම් **34**

## සාරාංශය

මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය සිදු කරන ලද්දේ ශ්‍රී ලංකාවේ පවතින සන්නද්ධ ගැටුම නිසා ළමුන් පීඩාවට පත්වන්නේ කෙසේ දැයි යන්න ගැන ඇති අවබෝධය තවදුරටත් පුළුල් කරගනු පිණිස ය. ගවේෂණාත්මක අධ්‍යයනයක් වශයෙන් සංකල්ප ගත කරන ලද මෙයට ඉලක්කගත වූයේ නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක තුනකි. සන්නද්ධ ගැටුම ඍජුව මෙන් ම වක්‍රව ද ළමුන්ට බලපා ඇති බව මෙම පර්යේෂණයේ දී අනාවරණය වූ කරුණුවලින් සනාථ විය. ශ්‍රී ලංකාවේ ගැටුම පවත්නා දිගු කාලසීමාව පිළිබඳ ව සලකන කල වැඩි වයසේ පසුවන බොහෝ ළමුන් සහ යොවුන් වැඩිහිටියන් ප්‍රචණ්ඩත්වය සහ අනාරක්ෂිතභාවය දරුණු ලෙස පැවති කාලවලට නිරාවරණය වී සිටි අතර දැනට ද ඔවුන් පසුවන්නේ භීතිය පිළිබඳ නිරන්තර හැඟීමකින් පෙළෙමිනි. පාසල් නිරතුරුව වසා දමා තිබීමත්, ප්‍රචණ්ඩත්වය පවතින කාලවල ගුරුවරුන් නොපැමිණීමත් හේතුවෙන් ඔවුන්ගේ අධ්‍යාපනයට බාධා පැමිණ තිබේ. මෙම වාර්තාවේ සාකච්ඡාවට භාජන කර ඇති පරිදි මරණය, අංග විකලත්වය, පවුලේ සාමාජිකයන් අහිමිවීම සහ විස්ථාපනය ආදී වශයෙන් ගැටුම ළමුන් කෙරෙහි බලපාන ආකාරයන් කිහිපයක් තිබෙන අතර, බොහෝ ළමුන් දරිද්‍රතාවට මුහුණ පෑමේ හේතුවෙන් ද ගැටුමින් පීඩාවට පත් ව ඇත. මෙම අධ්‍යයනයේ දී ආවරණය කරන ලද සෑම ගෘහවාසයක් ම පාහේ ගැටුමේ ප්‍රතිඵලයක් වශයෙන් වඩාත් දිළිඳු තත්වයට ඇද වැටී තිබේ. ගැටුම මගින් ඇති කරන ලද දරිද්‍රතාවයෙන් යුත් මෙම කලාපය තුළ පවත්නා අප්‍රමාණවත් මෙන්ම අබලන් මංමාවත්, රෝහල් සහ පාසල් වැනි යටිතල පහසුකම් ද ළමුන්ගේ වර්ධනය සහ ශුභසිද්ධිය කෙරෙහි බලපා ඇත. අවසාන වශයෙන්, ගැටුම නැවතත් ඇරඹෙතැයි යන ඉමහත් බියක් ළමුන් අතර මෙන් ම වැඩිහිටියන් අතර ද පවතින නමුදු, ගැටුම සහ තමන් ලද අත්දැකීම් අනුසාරයෙන් තමන් ද, තම පවුලේ සහ ප්‍රජාවන් ද මුහුණ පෑ ගැටළු ජය ගැනීමෙහි ලා ඉතා දැඩි අධිෂ්ඨාන ශක්තියක් සහ සම්පත් පූර්ණභාවයන් තමන් තුළ ඇති බැව් ළමුන් වෙතින් පළ විය.

# 1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වසර 20 කට අධික කාලයක් මුළුල්ලේ ඉතා දරුණු ප්‍රචණ්ඩ ගැටුමකට මැදි වී පීඩාවට පත්ව තිබේ. බොහෝ ජනයා මියගොස් ඇති අතර, රජයේ සහ පෞද්ගලික දේපලවලට විශාල හානි සිදු වී, ජනයාගේ මූලුමහත් ජීවන රටාවට බාධා පැමිණ ඇත. ගැටුම් පවතින කාලයන්හි බෙහෙවින් ම පීඩාවට පත් ව ඇත්තේ කාන්තාවන් සහ ළමුන් වැනි පහසුවෙන් හානියට ගොදුරු වන පිරිස්ය. ළමුන්ගේ නොනැසී පැවැත්ම, ආරක්‍ෂාව සහ ශුභසිද්ධිය අරමුණු කරගත් ගෝලීය ප්‍රඥප්තිය වන 1989 ළමා අයිතීන් පිළිබඳ සම්මුතිය (ළඅස) තිබුණ ද, "සන්නද්ධ අරගලය ළමුන් වෙත එල්ල කරන බලපෑම" පිළිබඳව[1] එක්සත් ජාතීන් වෙත ඉදිරිපත් කරන ලද 1996 මැකෙල් වාර්තාවට අනුව, යුද්ධය ළමුන් කෙරෙහි පැන නගින තර්ජන බෙහෙවින් ඉහළ නංවන අතර, ළමා අයිතීන් පිළිබඳ සම්මුතිය මගින් ඔවුන්ගේ ආරක්‍ෂාව සඳහා සපයා ඇති විධිවිධාන පැහැදිලිව ම උල්ලංඝණය කර තිබේ. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ද තත්වය මෙය ම බැව් පෙනී යයි. ශ්‍රී ලංකාවේ උතුරේ සහ නැගෙනහිර පවත්නා යුද්ධය නිසා ළමුන් 90,000 ක් තරම් අධික සංඛ්‍යාවක් පීඩාවට පත් ව ඇතැයි ද, ඔවුන් අතරින් තුනෙන් එකක් පමණ පිරිසක් යටත් පිරිසෙයින් වරක් හෝ විස්ථාපනය වී ඇතැයි ද ඇතැමුන් විසින් ගණන් බලා ඇත. (ළමාරක්‍ෂක වැඩසටහන, 1998, 2000).

කෙසේ වුව ද, ශ්‍රී ලංකාවේ ළමුන් කෙරෙහි ගැටුම බලපා ඇත්තේ කෙසේදැයි යන්න පිළිබඳ විධිමත් සහ ස්ථානගත තොරතුරුවල ඌනතාවක් පවතින්නේ ප්‍රධාන වශයෙන් ම මෙයට වසර කිහිපයකට ඉහත දක්වා ම උතුර සහ නැගෙනහිර පළාතට පිවිසීමේ ඉඩකඩ සම්බන්ධයෙන් ගැටළු පැවතීම හේතුවෙනි. උතුර සහ නැගෙනහිර පිළිබඳ සංඛ්‍යාලේඛනමය දත්ත තවමත් සැකසෙමින් පවතින අතර, දරිද්‍රතාවය පිළිබඳ ව ප්‍රදේශයට අදාළ සංඛ්‍යාලේඛණ මේ දක්වා නොමැති වීම හේතුවෙන් මෙම ප්‍රදේශය තුළ පසුගිය වසර 20 ක පමණ කාලයක් මුළුල්ලේ සිදු වී ඇති වර්ධනයන් සහ විපර්යාසයන් අවබෝධ කර ගැනීමේ කර්තව්‍යය දුෂ්කර වී තිබේ. සංවර්ධනය පිළිබඳ මැදිහත්වීම් සහ ප්‍රතිපත්ති බොහෝවිට සකසා ගනු ලැබ ඇත්තේ විධිමත් හෝ ස්ථානීය පර්යේෂණ පදනම් කර ගැනීමෙන් නොව රටේ වෙනත් ස්ථානයක හෝ ලෝකයේ වෙනත් තැනක සිදු වන එවැනි දේ අනුසාරයෙන් ලබා ගන්නා අත්දැකීම් පදනම් කරගෙනය.

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයෙහි දරිද්‍රතාව සහ ගැටුම් පිළිබඳ වැඩසටහන විසින් මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය සිදු කරන ලද්දේ ශ්‍රී ලංකාවේ ළමුන් සන්නද්ධ අරගලයෙන් පීඩාවට පත්වන්නේ කුමන ආකාරයෙන්දැයි යන්න පිළිබඳ ව ඇති අවබෝධය වඩාත් පුළුල් කර ලීමත්, උචිත මැදිහත්වීම් සිදුකිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදන සංවාදයන් වලට අවශ්‍ය තොරතුරු සැපයීමත් අරමුණු කර ගෙනය. ගැටුම්වලින් පීඩාවට පත් ප්‍රදේශයන්හි ළමුන්ගේ තථ්‍ය අත්දැකීම් සංවර්ධන සාකච්ඡාවන්හි අවධානයට ලක් කිරීමට ද, ළමා සොල්දාදුවන් වැනි ඇතැම් විශේෂිත කණ්ඩායම්වලට අදාළ කරුණු කිහිපයක් කෙරෙහි පමණක් යොමු වීමේ ප්‍රවණතාවක් පළ කරන සාකච්ඡාවන්ගෙන් මිදී යුද්ධයේ බලපෑම්වලින් ළමුන් පීඩාවට පත්වීම පිළිබඳ වඩාත් පොදු චිත්‍රයක් කරා යොමු කිරීමට ද මෙම අධ්‍යයනයෙන් ප්‍රයත්න දරේ.

සන්නද්ධ ගැටුම නිසා ළමුන් ඍජුව මෙන් ම වක්‍රව ද පීඩාවට පත්වීමට ඉඩ තිබේ. ප්‍රචණ්ඩත්වය හේතුවෙන් ඔවුන් මරණයට පත් වීමට, තුවාල ලැබීමට හෝ අංග විකලත්වයට පත් වීමට ඉඩ ඇත. ඔවුනට තම දෙමාපියන්ගෙන් කෙනෙකු හෝ දෙදෙනා ම, සහෝදර සහෝදරියන් සහ පවුලේ සෙසු සාමාජිකයන් අහිමි විය හැක. ඔවුනට තම වාසස්ථාන අහිමි ව ගොස් විස්ථාපනයට ලක්විය හැක. මේවා ගැටුමෙන් ඇති වන, හොඳින් දන්නා, පැහැදිලි ප්‍රතිඵල වේ. වඩාත් පැහැදිලි නැති මාර්ගවලින් ද ගැටුම ළමුන් කෙරෙහි බලපෑ හැක. ඔවුන්ගේ අධ්‍යාපනය ඇන හිට ගොස්, ඔවුන් ආදායම් උපදවන්නන් බවට පත් වීමට හෝ පවුලේ නඩත්තුව සඳහා ආදායම් උපයන කටයුතුවල නිරත වීමට හෝ ඔවුනට සිදු වේ. ගැටුම් පවතින ප්‍රදේශයන්හි ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී ස්වභාවයට පත් වීමේ, යටිතල පහසුකම් විනාශ වීමේ සහ අනාරක්ෂිතභාවය බලපාන දිගුකාලසීමාවන් පැවතීමේ ප්‍රතිඵලය වන්නේ ජනතාව දිළිඳුබවට පත්වීමයි. ගෘහවාසයක් වඩාත් දිළිඳුබවට පත් වූ කල්හි ළමුන්

1 මෙම සම්පූර්ණ වාර්තාව http://www./unicef.org/graca/. වෙතින් ලබාගත හැක. මෙම වාර්තාව පසුව ග්‍රැකා මැකෙල් විසින් "යුද්ධය ළමුන් කෙරේ එල්ල කරන බලපෑම, 2001" යන ප්‍රකාශය මගින් යාවත්කාලීන කර ඇත.

කෙරෙහි එය බලපාන්නේය. මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය තුළින් දිවෙන ප්‍රධාන තේමාවක් වන්නේ ගැටුම සහ දරිද්‍රතාවය අතර පවත්නා සම්බන්ධතාව පැහැදිලි කර දක්වීමයි. මෙම අධ්‍යයනය මගින් අපේක්ෂා කරන්නේ ළමුන්ගේ අත්දැකීම් ඔස්සේ විමසා බැලීමෙන් ගැටුම සහ දරිද්‍රතාව අන්‍යොන්‍ය වශයෙන් බැඳී පවතින්නේ කෙසේදයි යන්න පිළිබඳ ව ඇති අවබෝධය තවදුරටත් පුළුල් කිරීමයි.

ළමුන් අයත්ව සිටින ගෘහවාසයන්ට මුහුණ පෑමට සිදු ව ඇති ගැටළු සැලකිල්ලට ගැනීමකින් තොරව ළමුන්ට බලපාන ගැටළු පූර්ණ වශයෙන් අවබෝධ කරගත නොහැක. දෙමාපියන් දෙදෙනා ම ජීවත් ව සිටින එකක් හෝ ස්ත්‍රීමූලක එකක් හෝ වේවා, ගෘහවාසයන්හි ස්වභාවය ළමුන් කෙරෙහි යුද්ධය බලපා ඇති ආකාරයත්, ඔවුන් එයට මුහුණ දීමට කටයුතු කරන ආකාරයත් කෙරෙහි බලපෑනු ලබයි. එයට අමතරව, ගැටුම පිළිබඳ ව දනට පවත්නා දිග්ගැසුණු ස්වභාවයත්, වත්මන් අවබෝධතා ගිවිසුමත්[2] සැලකිල්ලට ගෙන මෙම අධ්‍යයනය සංකල්පගත කර ඇත්තේ හුදෙක්ම වත්මන් තත්වය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට නොවන අතර, විශේෂයෙන් ම ප්‍රචණ්ඩත්වය සහ අනාරක්ෂිතභාවය ඉතා දරුණු ලෙස පැවති කාලවල දී ළමුන් මුහුණ පෑ අතීත අත්දැකීම් අවබෝධ කර ගනු පිණිස ය.

මෙම අධ්‍යයනයේ එල්ලය යොමු වී ඇත්තේ නැගෙනහිර පළාත කෙරෙහිය. පර්යේෂණ ප්‍රදේශය භූගෝලීය වශයෙන් සීමා කිරීමට නිගමනය කරන ලද්දේ ගැඹුරින් අධ්‍යයනයක් සිදු කිරීමට ඉඩ පාදා ගනු පිණිසය. නැගෙනහිර පළාත අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලද්දේ මෙම ආකාරයේ පර්යේෂණයන් සිදු කිරීම සඳහා යෝග්‍ය ගතිලක්ෂණ කිහිපයකින් එම ප්‍රදේශය සමන්විත ව තිබීම නිසාය. නැගෙනහිර පළාතේ ජනගහනය මුස්ලිම්, සිංහල සහ ද්‍රවිඩ යන ජනවාර්ගික සම්මුසුවකින් යුක්ත වූවකි. එය තවදුරටත් ගැටුමට ලක්වීමට ඉඩකඩ තිබෙන, සාපේක්ෂක වශයෙන් උණුසුම් වාතාවරණයක් පවතින ප්‍රදේශයක් වශයෙන් සැලකේ. ශ්‍රී ලංකාව සමස්තයක් වශයෙන් ගත් කල, පර්යේෂණවලට ලක් වූ ප්‍රදේශයක් වශයෙන් මෙන් ම, සංවර්ධන මැදිහත්වීම් අතින් ද නැගෙනහිර පළාතට දක්වා ඇත්තේ අල්ප අවධානයකි. ගැටුමට අදාළ පර්යේෂණ සහ ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡාවල දී ද, ඇතැම්විට රටේ උතුරු පෙදෙසට සැලකිල්ල යොමු කරමින් එම ප්‍රදේශය නොතකා හැර තිබේ.

මෙම අධ්‍යයනයෙහිලා සීමිතභාවයන් තුනක් ඇත. විසි වසරක් පුරා ශ්‍රී ලංකාවේ පැවති ගැටුමේ ප්‍රතිඵලයක් වශයෙන් ළමුන් සැලකිය යුතු සංඛ්‍යාවක් අනාථයන් බවට පත් ව, ශුභසාධක මධ්‍යස්ථානවල ජීවත් වන අතර, මෙම අධ්‍යයනයේ අවධානය යොමු වන්නේ ආයතනික පරිසරයන්හි ජීවත්වන ළමුන්ට වඩා ගෘහවාසයන් තුළ මුල සිට ම වාසය කරන ළමුන් කෙරෙහිය. දෙවන සීමිතභාවය වන්නේ, මූලික වශයෙන් ක්ෂේත්‍ර පර්යේෂක කණ්ඩායමේ ආරක්ෂාව තකා ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි (එල්.ටී.ටී.ඊ.) පාලන ප්‍රදේශයන්හි ක්ෂේත්‍ර පර්යේෂණ කටයුතු සිදු නොකිරීමයි. අවසාන වශයෙන් කිවයුත්තේ, මෙම අධ්‍යයනයෙන් ආවරණය වන ප්‍රදේශ සහ එම ප්‍රදේශයන්හි වසන පවුල් සහ ළමුන් ඉන් අනතුරුව 2004 දෙසැම්බර් මස දී හට ගත් සුනාමි ව්‍යසනයෙන් දැඩි ලෙස විපතට පත් වූ බවයි. මෙකී ප්‍රදේශයන්හි පවුල්වලට සහ ළමුන්ට මුහුණ පෑමට සිදුවූ විපත්තිය සැලකිල්ලට ගැනීමෙන් 2004 දෙසැම්බර් මස දී ක්ෂේත්‍ර පර්යේෂණ නවතා දැමීමට නිගමනය කරන ලදී. එබැවින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙහි සිදු කිරීමට නියමිත ව තිබූ ගුණාත්මක සම්මුඛ සාකච්ඡා සම්පූර්ණ කිරීමට හැකි වූයේ නැත. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම වාර්තාවෙහි පිළිබිඹු වන්නේ පළාතේ දිස්ත්‍රික්ක තුනෙහි ගෘහවාසයන්හි තොරතුරු වන අතර ගැඹුරින් කළ සාකච්ඡා දක්වෙන්නේ 2004 දෙසැම්බර් 26 වන දිනට පෙර එක්රැස් කර ගන්නා ලද අම්පාර සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් පමණකි.[3]

වාර්තාව ප්‍රධාන කොටස් පහකට බෙදා දක්වා ඇත. මීළඟ කොටසින් දක්වෙන්නේ අධ්‍යයනයෙහි එළඹුම පිළිබඳ සමස්තාවලෝකනයක් සහ ක්‍රමවේදයයි. තෙවන පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරෙන්නේ ළමුන් වාසය කරන ගෘහවාසයන් පිළිබඳ සමස්තාවලෝකනයක් සහ ගැටුමෙන් තමන් පීඩාවට ලක් වූයේ කවර ආකාරවලින්දැයි යන්න පිළිබඳ ව ළමුන්ගේ සංජානනයන් පිළිබඳ ව ගෘහවාස මට්ටමින් කෙරෙන සාකච්ඡාවකි. ඉන් අනතුරුව ඇති පරිච්ඡේද දෙකෙහි අවධානය යොමු වී ඇත්තේ ළමුන් ලද අත්දැකීම් පිළිබඳවය. ළමුන්ගේ පාසැල් යෑම, ළමුන් කරන වැඩ සහ වෙනත් අංශ සම්බන්ධයෙන් ගැටුම

[2] අවබෝධතා ගිවිසුම යනුවෙන් පොදුවේ හඳුන්වනු ලබන සටන් විරාම ගිවිසුම ශ්‍රී ලංකාවේ රජයත්, එල්.ටී.ටී.ඊයත් අතර 2002 පෙබරවාරි මස දී අත්සන් තබන ලද්දකි.

[3] ඇමුණුම අංක 1 හි දක්වෙන ශ්‍රී ලංකාවේ සිතියම බලන්න.

බලපා ඇත්තේ කෙසේදැයි යන්න සිව් වන පරිච්ඡේදයෙන් සාකච්ඡාවට භාජන කෙරේ. පස්වන පරිච්ඡේදයෙන් ආවර්ජනය කෙරෙන්නේ වත්මනේ සහ අනාගතයේ දී රටේ පැවතිය හැකි තත්වය පිළිබඳ ව ළමුන්ගේ සංජානනයන් සහ ඔවුන්ගේ අනාගත අපේක්ෂාවන් පිළිබඳවය. අවසාන පරිච්ඡේදයේ දී වාර්තාවෙන් ඉස්මතු වන මූලික අනාවරණයන් එකට ගළපා, ඒවායින් පැන නගින ප්‍රතිපත්ති නිර්දේශයන් සාකච්ඡාවට භාජන කෙරේ.

මෙම පර්යේෂණය ස්ථිර ස්වභාවයේ එකකට වඩා ගවේෂණාත්මක වූවකි. අපගේ ඉලක්කය වන්නේ සංඛ්‍යාත්මක දත්තයන්ට හෝ සාමාන්‍යකරණයන්ට වඩා ළමුන් සහ ඔවුන්ගේ පවුල්වල තථ්‍ය අත්දැකීම්ය. මෙම අරමුණින් යුතුව, අප විසින් හැකිතාක් දුරට උත්සාහ දරන ලද්දේ තමන් යුද්ධයෙන් පීඩාවට පත් වූයේ කෙසේදැයි යන්න එම ළමුන්[4] ලවා ම ඉදිරිපත් කිරීමටය.

[4] ළමුන්ගේ නිර්නාමිකත්වය රැක ගැනීම උදෙසා සියලු නම් වෙනස් කර යොදා ඇත.

## 2. ක්‍රමවේදය සහ අධ්‍යයනයට අදාළ එළඹුම

"ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ" දක්වා ඇති ආකාරයට "ළමයා" යන්නෙහි නෛතික නිර්වචනය වන්නේ 18 වන වියට අඩු ඕනෑම තැනැත්තෙක් බවය. මෙම අධ්‍යයනය සඳහා සිදු කළ ප්‍රාථමික පර්යේෂණයේ දී පෙනී ගියේ "ළමයා" පිළිබඳ මෙම නිර්වචනයට අනුරූප වන පරිදි අධ්‍යයනයේ ඉලක්කය සීමා කිරීමෙන්, 18 වන විය මඳක් පසු කළ අයගේ ළමා වියේ අත්දැකීම් ලබා ගැනීම බැහැර කිරීමට සිදු වන බවය. ශ්‍රී ලංකාවේ ගැටුම පැවති දිගු කාලසීමාව පිළිබඳ ව සැලකීමේ දී ප්‍රචණ්ඩත්වයේ උච්චම අවස්ථාවෙහි ළමුන් වශයෙන් සිටි බොහෝ දෙනෙකු වත්මනෙහි ළමුන්ගේ ගණයට නොවැටෙන අතර, ඔවුන් අයත් වන්නේ යොවුන් වැඩිහිටියන්ගේ ගණයට ය. එසේ ම මෑත අතීතයේ සටන් විරාමය ගැන සලකන විට ද, 10 වන වියට අඩු වයසේ පසු වන ළමුන් බොහෝ දෙනෙකුට ගැටුමින් තමන් ඍජු ව පීඩාවට පත් වූ ආකාරය සිහිපත් කිරීමට හැකි නොවීමට ඉඩ තිබේ.

මෙම අධ්‍යයනයෙහි අවධානය යොමු කර ඇත්තේ ශ්‍රී ලංකාවේ ළමුන්ගේ අත්දැකීම් පිළිබඳ ව නිසා, හුදෙක් ඔවුන් තවදුරටත් නෛතික නිර්වචනයට අදාළ නොවීමේ හේතුවෙන් ළමුන් වශයෙන් සිටියදී සන්නද්ධ ගැටුමින් පීඩාවට පත් ඔවුනට තම අත්දැකීම් බෙදාහදා ගැනීමේ අවස්ථාව අහිමි නොකළ යුතු බවට හැඟී ගොස් තිබිණ. එබැවින් "ළමුන්" කණ්ඩායම් වශයෙන් ඉලක්ක කොට අධ්‍යයනය සිදු කිරීමට නිගමනය කරන ලදී: එනම්, 10 - 18 අතර සහ 19 - 25 අතර වයස් කාණ්ඩවල පසුවන්නන් වශයෙනි. වෙනත් වචනවලින් කිවහොත්. "ළමයා" පිළිබඳ ජාත්‍යන්තර නිර්වචනය කාල පරාස දෙකක් වශයෙන් - එනම්, ගැටුම පැවති සමය සහ අවබෝධතා ගිවිසුමෙන් පසු සමය යනුවෙන් - මෙම එළඹුමෙහි දී යොදා ගන්නා ලදී.

මෙම වාර්තාවෙහි "ළමයා" හෝ "ළමුන්" යන්නෙන් මෙම කණ්ඩායම් දෙකම දක් වේ. කෙසේ වුව ද, මෙය "ළමයා" පිළිබඳ නිර්වචනය ප්‍රතිනිර්මාණය කිරීමට දරන ලද ප්‍රයත්නයක් වශයෙන් නොසැලකිය යුතුය. මෙය ශ්‍රී ලංකාවේ සන්නද්ධ ගැටුමට අදාළ ළමුන්ගේ අත්දැකීම් පරිපූර්ණ වශයෙන් අවබෝධ කර ගැනීමට යොදා ගන්නා ලද හුදු උපක්‍රමයක් පමණකි.

මෙම අධ්‍යයන ප්‍රාථමික මෙන් ම ද්විතීයික දත්ත මත පදනම් ව ඇති අතර මතු දැක්වෙන කොටසින් අනුගමනය කරන ලද ක්‍රමවේදය පිළිබඳ සමස්තාවලෝකනයක් ඉදිරිපත් කෙරේ.

### ප්‍රාථමික දත්ත

මීට ඉහත දී සඳහන් කළ පරිදි පර්යේෂණය ඉලක්කගත වූයේ නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක තුනක් කෙරෙහි ය. තොරතුරු එක්රැස් කර ගන්නා ලද්දේ ප්‍රදේශයේ කටයුතු කරන සංවිධාන, ගෘහවාසයන් සහ ළමුන් සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා මාර්ගයෙනි. එබඳු සංවිධාන සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමේ අරමුණ වූයේ ළමුන් සඳහා ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති කවරේද යන්නත්, ගැටළුවලට විසඳුම් සෙවීමේ දී ඔවුන් සාර්ථකත්වයක් ලබා ඇත්ද යන්නත් සහ කවර ප්‍රතිචාරයන් තවදුරටත් දියුණු කරලීම හෝ පුළුල් කරලීම අවශ්‍ය වේ ද යන්නත් හඳුනා ගැනීමයි. පිවිසීමට ඇති හැකියාව සහ ජනවාර්ගික සංයුතිය වැනි කරුණු පැහැදිලි කර ගැනීමෙන් අධ්‍යයනයේ නියැදිය සඳහා සුදුසු ගම් හඳුනා ගැනීමට ද මෙම සම්මුඛ සාකච්ඡා උපකාරී විය.

ගෘහකුටුම්භ සමීක්ෂණ නියැදිය සකසා ගන්නා ලද්දේ ඒකාබද්ධ නියැදිගත කිරීමේ ක්‍රමය යොදා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති කර ගන්නා ලද ස්තරීභූත අහඹු නියැදියක් (*Stratified random sample*) අනුසාරයෙනි. පළමුවන අදියරේ දී, සෑම දිස්ත්‍රික්කයක ම ජනවාර්ගික සංයුතිය පිළිබිඹු වන පරිදි නියැදියේ අන්තර්ගත ගෘහවාසයන් සංඛ්‍යාව නිගමනය කරන ලදී. මේ සඳහා 2001 වසරේ ජනසංගණනය උපයෝගී කරගනු ලැබිණ. ගෘහවාසයන් තෝරා ගැනීම සඳහා පදනම් වූයේ ආදායම හෝ දරිද්‍රතාවේ වෙනත් දර්ශකයක් හෝ නොවේ. ඒ වෙනුවට සමීක්ෂණය සඳහා අහඹු ලෙස තෝරා ගැනුනේ 10 - 25 අතර වයස් සීමාවේ පසු වන යටත් පිරිසෙයින් එක් ළමයෙකු හෝ යොවුන් වැඩිහිටියෙකු හෝ සිටින එක් එක් නිවාසයන්ය. සමීක්ෂණය යොමු කරන ලද්දේ ගෘහවාසයේ මූලිකයා හෝ ඔහුගේ/ඇයගේ සහකරු වෙතය. සම්මුඛ සාකච්ඡා ඇරඹීමට පෙරාතුව නිවාස පිහිටි ස්ථානයන් හඳුනා ගැනීම සඳහා මෙන් ම ගම පිළිබඳ සාමාන්‍ය විස්තරයක් සපයා ගැනීම සඳහා සෑම ගමක් ම සිතියම්ගත කරන ලදී.

නියැදියේ රාමුවට අනුව දිස්ත්‍රික්ක තුනෙහි ගෘහවාසයන් පිළිබඳ සම්මුඛ සාකච්ඡා 310 ක් පවත්වන ලදී. එකී සම්මුඛ සාකච්ඡා 310 අතුරින් හතක් ඉවත ලෑමට සිදු වූයේ ඒවායේ ගැබ් වූ දත්ත අසම්පූර්ණ වීම හේතුවෙනි. මෙහි පහතින් දක්වෙන වගුවෙන් ගෘහවාසයන් පිළිබඳ නියැදියේ අවසාන සැකැස්ම ඉදිරිපත් කෙරේ.

**වගුව 2.1 ගෘහවාසයන් පිළිබඳ නියැදියේ ව්‍යාප්තිය[5]**

| ජනවාර්ගිකත්වය | සිංහල | ද්‍රවිඩ | මුස්ලිම් | එකතුව |
|---|---|---|---|---|
| **දිස්ත්‍රික්කය** | | | | |
| අම්පාර | 41 | 21 | 38 | 100 |
| මඩකලපුව | ලැ/නො | 62 | 38 | 100 |
| ත්‍රිකුණාමලය | 38 | 23 | 42 | 103 |
| එකතුව | 79 | 106 | 118 | 303 |

මීට ඉහත දී ද සඳහන් කළ පරිදි, ගෘහවාසයන් පිළිබඳ නියැදියේ ජනවාර්ගික ව්‍යාප්තිය පදනම් ව ඇත්තේ 2001 වසරේ ජනසංගණනය මතය. එසේ වුව ද, 2001 ජනසංගණනය මගින් උතුරු සහ නැගෙනහිර පළාත්වල ඇතැම් ප්‍රදේශයන් ආවරණය නොවූ හෙයින් එහි දක්වා ඇති සංඛ්‍යාවන් සැලකිය යුත්තේ තාවකාලික ඒවා වශයෙනි. බැලූ බැල්මට පෙනෙන්නට ඇති පරිදි මෙම සංඛ්‍යාවන් සාමාන්‍යයෙන් පිළිගැනීමට පාත්‍ර ව ඇති අතර (නිදසුන් වශයෙන්, මඩකලපුව දිස්ත්‍රික්කයේ වසන සිංහල ජනයාගේ සංඛ්‍යාව ජනසංගණනයට අනුව දක්වෙන්නේ 1% කටත් වඩා අඩුවෙන් නිසා ඒ අනුව මෙම දිස්ත්‍රික්කයේ කිසිදු සිංහල ගෘහවාසයක් නියැදියෙන් ආවරණය කර නොමැත) 1981 වසරේ දී කර තිබූ ඉහත ජනසංගණනයට වඩා සැලකිය යුතු විසංගතයන් පෙනෙන ස්ථානවල එයට සරිලන පරිදි නියැදිය ට ගැළපුම් සිදු කරන ලදී. (නිදසුන් වශයෙන්, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍යයෙන් සිදු කරනු ලැබූ සම්මුඛ සාකච්ඡා ගණන ඉහල දැමූ අතර මේ නිසා දිස්ත්‍රික්කය තුල සම්මුඛ සාකච්ඡා ගණන 100 කට වැඩි විය.)

දිස්ත්‍රික්ක තුනෙහි ම කල් තබා නියමුගත කරන ලද ව්‍යුහගත කළ ප්‍රමාණාත්මක ප්‍රශ්නාවලි (*Structured quantitative Questionnaire*) මාර්ගයෙන් ගෘහවාස මට්ටමේ තොරතුරු එක්රැස් කර ගන්නා ලදී. පළපුරුද්ද හෝ ඒ හා සමාන කටයුතු කෙරෙහි ඇති කුශලතාව පදනම් කර ගෙන තත් ප්‍රදේශයන්ගෙන් තෝරා ගන්නා ලද ගණන් ගන්නන් (*enumerator*) නව දෙනෙකුගේ මාර්ගයෙන් එය ක්‍රියාවට නංවනු ලැබීය. සමීක්ෂණය ඇරඹීමට පෙරාතුව, ගණන් ගන්නා අය නියැදි ශිල්පීයක්‍රම, සමාජීය සිතියම්ගත කිරීම සහ සම්මුඛ සාකච්ඡා මෙහෙයවීමේ කුශලතාවන් පිළිබඳ එක් දින වැඩමුළුවකට සහභාගී වූහ.

ගෘහවාසයන් පිළිබඳ නියැදිය පදනම් කර ගෙන, වඩාත් ගැඹුරු එයද ගුණාත්මක සම්මුඛ සාකච්ඡාවන් සඳහා ළමුන්ගේ වඩා කුඩා නියැදියක් හඳුනා ගන්නා ලදී. එයද ජනවාර්ගික ව්‍යාප්තිය පදනම් කර ගෙන සිදු කරන ලද නමුදු, ගැටුම පැවති කාලවකවානුව සහ අසනු ලැබූ ප්‍රශ්නවල සංවේදිතාව සැලකිල්ලට ගෙන මේ සඳහා තෝරා ගන්නා ලද්දේ 15 - 25 අතර වයස් සීමාවේ පසුවූ වයසින් වැඩි ළමුන්ය. මෙම සම්මුඛ සාකච්ඡා සිදු කරන ලද්දේ අර්ධ ව්‍යුහගත කළ ගුණාත්මක ප්‍රශ්නාවලියක් උපයෝගී කර ගනිමිනි.

එසේ ම, ඉහතින් ද සඳහන් කළ පරිදි, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ළමුන් සමඟ පැවැත්වීමට සැලසුම් කර තිබූ සම්මුඛ සාකච්ඡාවන් 2004 දෙසැම්බර් 26 වන දින හට ගත් සුනාමියේ දී සිදු වූ විනාශය හේතුවෙන් පැවැත්විය නොහැකි විය. අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්කයන්හි ළමුන් සමඟ සම්මුඛ සාකච්ඡා 30 ක සමස්ත සංඛ්‍යාවක් පවත්වන ලදී.

---

[5] ශ්‍රී ලංකාවේ සිතියම සඳහා ඇමිණුම අංක 1 ද, සෑම දිස්ත්‍රික්කය ම ආවරණය කළ ගම්වල නාමාවලියක් සඳහා ඇමිණුම අංක 2 ද කරුණාකර බලන්න.

*ද්විතීයික දත්ත*

ගැටළු හඳුනා ගැනීමේ සහ දැනුම පිළිබඳ පවත්නා හිඩැස් පිරවීමේ අරමුණින් අධ්‍යයනයේ එක් අංගයක් වශයෙන් ළමුන්ට, දරිද්‍රතාවට සහ සන්නද්ධ ගැටුමට අදාළ පතපොත පිළිබඳ පුළුල් විමර්ශනයක් සිදු කරන ලදී. ශ්‍රී ලාංකීය සන්දර්භයෙහි ලා ළමුන්ට සහ සන්නද්ධ ගැටුමට අදාළ ගැටළු හඳුනා ගැනීම ද, පතපොත පිළිබඳ විමර්ශනයෙන් අපේක්ෂා කෙරිණ. තව ද, ගැටුම සමඟ බැඳී ඇති නැගෙනහිර පළාතේ ප්‍රධාන සිද්ධීන් ද මෙමගින් හඳුනා ගන්නා ලදී. සන්නද්ධ ගැටුමක දී ළමුන්ට බලපාන අධ්‍යාපනය, විස්ථාපනය, සෞඛ්‍යය, පෝෂණය සහ ළමා සොල්දාදුවන් බඳවා ගැනීම ඇතුළත් ළමා ශ්‍රමය වැනි විවිධ මානයන් කෙරෙහි අධ්‍යයනය යොමු කරලීමට විමර්ශනය උපකාරී විය. ශ්‍රී ලංකාවේ සන්නද්ධ අරගලයෙන් ළමුන් කෙරෙහි ඇති වන ප්‍රතිඵල පිළිබඳ තොරතුරු ගැඹුරු විශ්ලේෂණයකට වඩා සාමාන්‍යයෙන් දරනු ලබන්නේ විශාල ප්‍රමාණයේ අධ්‍යයනයන්හි ස්වරූපයකි. ගෘහවාස මට්ටමින් සහ ළමුන් තනි තනි වශයෙන් අධ්‍යයනය කිරීමෙන් එක්රැස් කරගත් ප්‍රාථමික දත්ත මගින් දැනුම පිළිබඳ ව පවත්නා ඇතැම් හිඩැස් පුරවා ලීම කෙරෙහි මෙම අධ්‍යයනයෙහි දී අවධානය යොමු කර ඇත.

## 3. ගෘහවාසයන් ට ගැටුම / යුද්ධයෙන් ඇති වී තිබෙන බලපෑම්

ගැටුම ළමුන් කෙරෙහි බලපා ඇත්තේ කෙසේදැයි අවබෝධ කරගනු පිණිස, මුලින් ම ළමුන් වාසය කරන ගෘහවාසයන්ට ගැටුම බලපා ඇති ආකාරය තේරුම් ගැනීම අවශ්‍ය කෙරේ. මෙම කොටසෙහි අවධානය ගෘහවාසයන් කෙරෙහි යොමු වන අතර, විශ්ලේෂණය මූලික වශයෙන් සකසා ගෙන ඇත්තේ ගෘහවාසයන් පිළිබඳ සමීක්ෂණයෙන් ලබාගත් තොරතුරු අනුසාරයෙනි.

### 3.1 නැගෙනහිර පළාත පිළිබඳ සමස්තාවලෝකනයක්

මෙම වාර්තාව රචනය කරන අවස්ථාවේ දී නැගෙනහිර පළාත පිළිබඳ නිල දරිද්‍රතා දත්ත අසම්පූර්ණ ව පැවති අතර, රටේ සෙසු ප්‍රදේශ සමඟ නැගෙනහිර පළාතේ දරිද්‍රතා තත්වය සැසඳීම දුෂ්කර විය. දත්ත පිළිබඳ හිඟයක් පැවතුන ද, රටේ මෙම ප්‍රදේශය ආදායම, පිවිසීමට ඇති අපහසුව සහ යටිතල පහසුකම් අතින් ඌව පළාතට[6] ද වඩා දිළිඳු විය හැකි බවට පොදු පිළිගැනීමක් තිබේ. (වගුව 3.1.1 බලන්න)

**වගුව 3.1.1 ගෘහවාසී ආදායම සහ වියදම**

| | නැගෙනහිර | ඌව[7] | ජාතික[8] |
|---|---|---|---|
| සාමාන්‍ය ගෘහවාස ආදායම (රු) | 7,640 | 10,388 | 12,803 |
| මධ්‍යම ගෘහවාස ආදායම (රු) | 5,500 | 6,680 | 8,482 |
| ඒකපුද්ගල ආදායම (රු) | 1,777 | 2,528 | 3,056 |
| සාමාන්‍ය ගෘහවාස වියදම (රු) | 10,769 | 9,352 | 13,147 |
| ආහාර වෙනුවෙන් සාමාන්‍ය වියදම (%) | 58.8 | 49.1 | 44.5 |

*මූලාශ්‍රය:* උතුරු සහ නැගෙනහිර පළාත්වල ගෘහවාසී ආදායම සහ වියදම පිළිබඳ සමීක්ෂණය, 2002/2003.

නැගෙනහිර පළාතේ සාමාන්‍ය ගෘහවාසී ආදායම ජාතික සාමාන්‍යයෙන් 60% ක් වන මසකට රු. 7,640/- ක පමණ ප්‍රමාණයක් වෙතැයි ගණන් බලා ඇත. නැගෙනහිර පළාතේ ජනගහනයෙන් අඩකටත් වඩා වැඩි පිරිසක් මසකට ලබන්නේ ඊටත් අඩු ආදායමක් (මසකට රු. 5,500/= ක්) බව ගණන් බලා ඇති අතර අන්ත දිළිඳු ගෘහවාසයන් අතුරින් 20% කගේ සාමාන්‍ය මාසික ආදායම රු. 1799/= ක් තරම් පහළ මට්ටමේ එකක් බවත් ගණන් බලා තිබේ. දරිද්‍රතාව පිළිබඳ නැගෙනහිර පළාතට අදාළ ගණනය කිරීම් තවමත් ලබා ගැනීමට නොමැති නමුදු, ප්‍රාථමික දත්ත මඟින් දක්වෙන්නේ ගෘහවාසයන් අතුරින් 50% කට වැඩි සංඛ්‍යාවක් ජීවත් වන්නේ දරිද්‍රතා රේඛාවට පහත මට්ටමෙහි බවය. (ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (ජසදෙ 2003c, 2004a, 2004b).[9]

ගෘහවාසයේ ආදායම ගෘහවාසීන්ගේ රැකියාවේ ආකාරය සමඟ ආසන්න ව බැඳී පවතී. නැගෙනහිර පළාතේ ජනගහනයෙන් විශාල ප්‍රමාණයක් නිරතව සිටින්නේ කෘෂි සහ ධීවර යන කර්මාන්තයන්හිය. නවීන විධි සහ තාක්ෂණය ප්‍රමාණවත් තරම් අනුගත කර ගැනීමකින් තොර ව මෙම අංශ තවමත් ක්‍රියාත්මක ව පවතින්නේ සාම්ප්‍රදායික වෘත්තීන් වශයෙනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉහළ මට්ටමේ යෙදවුම් සහ නිෂ්පාදන පිරිවැය දැරීමට සිදු ව ඇති අතර ඒවායේ ඵලදායීතාවය සහ ලාභදායීබව හීන වී ඇත. මෙම ප්‍රදේශය සුළිසුළං හා ජල ගැලීම් වැනි අහිතකර කාලගුණ තත්වයන්ට නැඹුරු ව පැවතීම හේතුවෙන් කෘෂි සහ ධීවර යන අංශ දෙකට ම ඉතා බරපතළ හානිවලට මුහුණ පෑමට සිදු ව තිබේ. අවසාන වශයෙන් දැක්විය යුත්තේ, ගැටුම් හේතුවෙන් පසුගිය විසි වසර මුලුල්ලේ එහා මෙහා යෑම පිළිබඳ සීමාවන් පනවා තිබීම නිසා, ගොවීන්ට තම වගාබිම්වලට පිවිසීමට නොහැකි වීමෙන් ද, ධීවරයන්ට ඇතැම් ජල ප්‍රදේශවලට ඇතුල් වී මසුන් මැරීමෙහි නිරතවීම වළකා තිබීමෙන් ද ආර්ථිකයේ මන්දගාමී ස්වරූපයක් ඇතිවීමට තුඩු දී ඇති බවයි.

---

6 ශ්‍රී ලංකාවේ සිතියම සඳහා ඇමිණුම 1 බලන්න.

7 උතුරු සහ නැගෙනහිර පළාත් හැරුනු විට ශ්‍රී ලංකාවේ අන්ත දිළිඳු පළාත ඌව වශයෙන් සැලකෙන බැවින් සැසඳීම පිණිස එම පළාත යොදා ගන්නා ලදී.

8 උතුරු සහ නැගෙනහිර පළාත්වල දත්ත මින් බැහැර කර ඇත.

9 2002 වසරේ ගෘහවාස ආදායම සහ වියදම පිළිබඳ සමීක්ෂණයට අනුව එක් ගෘහවාසයක ඒකපුද්ගල දරිද්‍රතා රේඛාව නිගමනය කර ඇත්තේ රු. 1,423/= ක් වශයෙන් වන අතර, ගෘහවාසයක ජාතික සාමාන්‍යයේ ප්‍රමාණය වන්නේ පුද්ගලයන් 4.2 ක සංඛ්‍යාවකි. (ජසදෙ. 2003b).

මෙම පළාත දරිද්‍රතාවට මංපාදන අසතුටුදායක යටිතල පහසුකම් හේතුවෙන් ද පීඩාවට ලක් ව ඇත. මාර්ග ජාලය නඩත්තු කිරීම පවතින්නේ අසතුටුදායක තත්වයක වන අතර, ගැටුමට සම්බන්ධ පාර්ශව විසින් හඳුන්වා දී ඇති මාර්ග බාධක, මුරකපොලු, වක්‍ර ගමන් මාර්ග සහ වෙනත් බාධාවන් නිසා ප්‍රවේශය තවදුරටත් සීමා කර ඇත. සෞඛ්‍ය සේවාවන් බොහෝවිට ඇත්තේ නාගරික මධ්‍යස්ථානයන්හිය. රටේ උපත් ප්‍රමාණයෙන් 98.9% ක් සඳහා සෞඛ්‍යාරක්ෂක වෘත්තිකයන්ගේ සහාය ලැබෙන නමුදු, මඩකලපුවේ එම ප්‍රතිශතය 68.6 ක් ද, අම්පාරේ 80% ක් ද, ත්‍රිකුණාමලයේ 86% ක් ද වශයෙන් පහත මට්ටමක පවතී. රටේ ජාතික සාමාන්‍යය වන 29% සමඟ සසඳන කල, මෙම ප්‍රදේශයේ මාස 3 - 59 වයස් ප්‍රමාණයේ දරුවන් 44% - සිට 53% අතර ප්‍රමාණයක සංඛ්‍යාවක් බරෙන් අඩුය. ත්‍රිකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්කයන්හි ජනගහනයෙන් 70% ක් තරම් ප්‍රතිශතයකට සෞඛ්‍යාරක්ෂක වැසිකිළි පහසුකම් නොමැති අතර එයට හේතු වී ඇත්තේ යුද්ධය නිසා නිවෙස් විනාශයට පත් වීම සහ විස්ථාපනයට ලක් වීම මෙන් ම දරිද්‍රතාවයි. (ජසදෙ 2004b).

ලබාගත හැකි දත්ත සීමිත ව පැවතීම නැගෙනහිර පළාතේ වත්මන් දරිද්‍රතා තත්වය හෝ ගැටුමින් උද්ගත ව ඇති දරිද්‍රතාවේ බලපෑම පිළිබඳ ගැඹුරු සාකච්ඡාවන්ට බාධා පමුණුවන අතර ම, දක්නට ලැබෙන චිත්‍රයෙන් ආදායම පිළිබඳ ව මෙන් ම අනෙකුත් දර්ශකයන් පිළිබඳ ව ද පුළුල් ව පැතිර පවත්නා දරිද්‍රතාව විදහා දක්වයි. ගෘහවාසයන් පිළිබඳ සමීක්ෂණයෙන් අරමුණු කරන ලද්දේ ගැටුම සහ දරිද්‍රතාව ගෘහවාසයන් කෙරෙහි බලපා ඇති විවිධ මානයන් අවබෝධ කර ගැනීමය. මෙහි පහත සාකච්ඡාවට භාජන කර ඇති සමීක්ෂණයේ ප්‍රතිඵලයන් මගින් ගෘහවාසයන්හි යථාදෘෂ්ටියට අනුව සමස්ත චිත්‍රයක් ඉදිරිපත් කෙරෙන අතර ම ළමුන් සමඟ ගැඹුරින් පවත්වන ලද ගුණාත්මක සම්මුඛ සාකච්ඡාවල දී ඉස්මතු වූ ගැටළු වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම පිණිස සුදුසු පසුතලයක් ද ඉන් සැකසේ.

## 3.2 ගැටුම පිළිබඳ ගෘහවාසයන්හි සංජානනයන්

ශ්‍රී ලංකාවේ යුද්ධය සිදු කරනු ලබන්නේ ඉමහත් මානව සහ ආර්ථික සම්පත් ප්‍රමාණයක් වැය කරමින් වන අතර, එය ගැටුම් පවතින ප්‍රදේශයන්හි ජනයා කෙරෙහි ඍජු සහ වක්‍ර ප්‍රතිඵල දිගින් දිගට ම ඇති කරවයි. ''ගැටුම ඔබගේ ගෘහවාසයට බලපා ඇත්තේ කෙසේ ද?'' යන ප්‍රශ්නයට ගෘහවාසී ප්‍රතිචාරකයන් පිළිතුරු සපයා ඇති ආකාරය 3.2.1 වගුව මගින් දක්වේ.

**වගුව 3.2.1 ගැටුම ඔබගේ ගෘහවාසයට බලපා ඇත්තේ කෙසේ ද?**

| දර්ශකයන් | ප්‍රතිචාර සංඛ්‍යාව | ගෘහවාසයන්හි ප්‍රතිශතය (%) |
|---|---|---|
| නිවාස, දේපල, ඉඩම අහිමි වීම | 254 | 85.8 |
| ආදායම අහිමි වීම | 251 | 84.8 |
| පවුල විස්ථාපනය වීම | 242 | 81.8 |
| ගමනාගමනයට දුෂ්කරතා ඇතිවීම | 142 | 48.0 |
| අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා ගැනීමට දුෂ්කරතා මතුවීම | 126 | 42.6 |
| පවුලේ සාමාජිකයන් අහිමි වීම | 77 | 26.0 |
| අධ්‍යාපනය කඩාකප්පල් වීම | 71 | 24.0 |
| අංගවිකලත්වය | 15 | 5.1 |
| **මුළු ප්‍රතිචාර සංඛ්‍යාව** | **1178**[10] | |

*මූලාශ්‍රය:* ක්ෂේත්‍ර දත්ත (ගෘහවාසයන් පිළිබඳ සමීක්ෂණය) 2004.

නියැදියට ඇතුළත් ගෘහවාසයන්ට ගැටුම බලපා ඇති බවට ඉතාමත් බහුල වශයෙන් වාර්තා කළ ආකාරයන් වන්නේ දේපල අහිමිවීම සහ ආදායම අහිමිවීමයි. ගෘහවාසයන්ට තම දේපල අහිමි වී ගොස් ඇත්තේ නිවස විනාශයට පත් වීම, සන්නද්ධ කණ්ඩායම් විසින් දේපල බලෙන් අත්කර ගැනීම, නිත්‍යානුකූල හිමිකරුවන් දේපල අතැර දමා විස්ථාපන වීමේ ප්‍රතිඵලයක් වශයෙන් අන් අය විසින් ඒවා අත් කර ගැනීම, බිම් බෝම්බ හේතුවෙන් නිවස සහ දේපල අතැර දමා යෑම සහ පනත් මගින් දේපල වාසයට නුසුදුසු ඒවා බවට පත් කිරීම ආදී මාර්ගවලිනි.

[10] මෙම ප්‍රශ්නයට බහුවිධ පිළිතුරු සැපයිය හැකිව තිබූ නිසා ප්‍රතිචාර 303 කට වැඩි සංඛ්‍යාවක් වාර්තාගත කරන ලදී.

*"1990 අවුරුද්දේ රෑ ඉෂා යාඥාවට ගිහින් හිටිය පිරිමි 119 ක් විතර ගමේ පල්ලියේ දී මරා දාලා තිබුණා. . . අපි අපේ ගෙවල් දාලා ගිහින් පල්ලියෙ නවාතැන් ගත්තා. ඒ කාලෙදී අපේ බඩුමුට්ටු සේරම හොරකම් කරගෙන, ජනෙල් පවා ගළවා ගෙන ගිහින් තිබුණා."*

(මුස්ලිම් පවුලක්, මඩකලපුව)

දේපල අහිමි වීම ආදායම අහිමි වීම සමඟ ද බැඳී තිබේ. ඇතැම් අවස්ථාවල දී කෘෂි සහ ධීවර උපකරණ වැනි ආදායම උපදවන දේපල හා කෘෂි අතිරික්තය යුද්ධයෙන් විනාශයට පත් වී ඇත.

*"අපි කමරවෝලෙ වනාන්තරේට වැදුණා (...). අපේ ගෙදර වී ගොඩක් ගබඩා කරලා තිබුණා. ඒ සේරම නැති වුණා. ෂෙල් වෙඩිවලින් අපේ පොල් ගස් තුනකට හානි වුණා. අපේ ගේ මුලුමනින් ම කැඩිලා ගියා."*

(ද්‍රවිඩ පවුලක්, මඩකලපුව)

ගෘහවාසී ප්‍රතිචාරකයන් අතුරින් 50% කට වැඩි සංඛ්‍යාවක් පළ කළේ ගැටුමේ ප්‍රතිඵලයක් වශයෙන් තම පවුල දිගුකාලීන හෝ සදාකාලික විස්ථාපනයට ලක් ව ඇති බවය. කැපී පෙනෙන කරුණක් වූයේ, සමීක්ෂණයේ දී ආවරණය කරන ලද පවුල් බොහොමයක් කිසියම් ප්‍රමාණයකට විස්ථාපනය අත්විඳ ඇති බවය. ඇතැමුන්ට රෑ කල තම නිවෙස හැර ගොස් තම ඥාතීන් සමඟ හෝ පාසල් වැනි පොදු ස්ථානයක ලැගුම් ගෙන, දවල් කාලයට පමණක් පෙරලා නිවසට පැමිණීමට සිදුව තිබූ අතර, සෙසු අයට වඩාත් දිගු කාලයක් මුළුල්ලේ, ඇතැම්විට වසර ගණනාවක් පුරා තම නිවෙස්වලින් විස්ථාපනය වී සිටීමට සිදු ව ඇත. ඉහත දක්වා ඇති සිද්ධිය බඳු වෙනත් බොහෝ සිද්ධීන්වලින් පෙනී යන්නේ පවුල් තම නිවෙස් කරා පෙරලා පැමිණි කල්හි බොහෝවිට දක්නට ලැබුණේ තම දේපලවලට හානි පැමිණ තිබූ බව, මංකොල්ල කා ඇති බව හෝ අන් අය විසින් ඒවා සතු කර ගෙන ඇති බවය.

*"අපි බොහෝ වෙලාවලට නිදා ගත්තෙ කැලේ... දෙමළ අය ඇතුළු අපේ සේරම අසල්වැසියො ගොවිපල අතැර දාලා ගියා (...). ඔවුන් ගොවිපලේ ට්‍රාන්ස්ෆෝමරය පුපුරවා හැරලා, ගොවිපලේ තිබුණ ට්‍රැක්ටරුත්, වාහනත් අරන් ගියා. ග්‍රාම ආරක්ෂකයොත් බයේ ගම දාලා පැනලා ගියා."*

(සිංහල පවුලක්, අම්පාර)

*"වවුනියාව අනාථ කඳවුරේ ජීවිත හරි දුෂ්කර හින්දා 1992 දී අපි ආපහු ආවා. අපි ආපහු ඇවිත් බලන කොට අපේ ගෙට හානි පැමිණිලා. ළිඳත් ජරා වෙලා. අපේ එළදෙනුන් අතුරුදහන් වෙලා."*

(ද්‍රවිඩ පවුලක්, මඩකලපුව)

## 3.3 ගැටුම සහ දරිද්‍රතාව පිළිබඳ සංජානනය

ගෘහවාසයන් විසින් සපයන ලද තොරතුරුවලින් ඉතා බහුල වශයෙන් දක්වූයේ ගැටුමින් ජනයා තවදුරටත් දිළිඳු බවට පත් වී ඇති බවය. ඔවුනට තම නිවෙස්. ඉඩම් සහ සෙසු දේපල අහිමි ව ගොස් ඇත. ඔවුනට තම ආදායම් මාර්ග අහිමි ව ගොස්, ඔවුන්ගේ සමාජ ජාල සහ ප්‍රජා සම්බන්ධතා බිඳී විසිර ගොස් ඔවුන් විස්ථාපනයට ලක් ව ඇත.

ගැටුම දිළිඳු බවට මං පාදන බව සනාථකරන ඉතාමත් පැහැදිලි නිදසුන් දක ගැනීමට ලැබුණේ ගැටුමට මැදි ව තම පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නා පවුල්වලට අහිමි ව ගොස් තිබූ අවස්ථාවන්හිදීය.

*"අපේ තාත්තා 1990 ගැටුමේ දී මැරුණා (...). ඔහුගේ මරණය අපේ පවුලට උහුලන්න බැරි බරක්. එදා අපේ තාත්තා වැඩට ගියා. පස්සෙ අපිට ආරංචි වුණා තාත්තා මළා කියලා. තාත්තගෙ මරණෙන් පස්සේ අපේ අම්මා කුලී වැඩට ගියා."*

(ද්‍රවිඩ පවුලක්, අම්පාර)

තම ජීවනෝපාය සඳහා ආධාර කරගන්නා ඔරු, ගොවිතැන් වැඩට යොදා ගන්නා යන්ත්‍රසූත්‍ර සහ කුකුළන්, එළුවන් සහ එළදෙනුන් වැනි තමන් ඇති කරන සතුන් අහිමි ව යෑම ගැන ද ගෘහවාසී ප්‍රතිචාරකයෝ සඳහන් කළහ. වගාබිම්, කෘෂි හා ධීවර ආම්පන්න වැනි ආදායම් උපදවීමට යොදා ගන්නා වත්කම් අහිමි ව ගිය කල, පැහැර ගත් විට හෝ වෙනත් ආකාරයකින් විනාශ කළ, නැතහොත් හානියට පත් කළ කල්හි පවුල් තවදුරටත් දිළිඳු බවට පත් වේ.

*"අපෙ තාත්තාට පුංචි ඔරුවක් තිබුණා. 1985 කැරලි කෝලාහල කාලෙදී කවුදෝ ඒ ඔරුව හොරෙන් ගෙනිහින්. දැන් තාත්තාට ඔරුවක් නැති හින්දා එයා කුලියට වෙනින් අයගෙ ඔරුවල වැඩ කරනවා."*

(මුස්ලිම් පවුලක්, අම්පාර)

විශේෂයෙන් ම එල්ටීටීඊ පාලන ප්‍රදේශවල ඇති තම කුඹුරුවලට යා ගත නොහැකිවීම සහ අස්ථාවර ආරක්ෂක තත්වය නිසා නිසි කලට අස්වනු නෙළා ගත නොහැකි වීම ද, මෙයට අදාළ ව දක්වන ලද කරුණු අතර විය.

*"යුද්ධය නිසා අපිට ආර්ථික අතින් පහර වැදුනා. අපේ වී වගාවට ඒක බලපෑවා. අපිට වෙලාවට අස්වැන්න නෙළා ගන්න ලැබුණෙ නෑ. මේ වගෙ තත්වයන් බොහෝ වෙලාවට ඇති වෙනවා."*

(මුස්ලිම් පවුලක්, අම්පාර)

දරිද්‍රතාවය නිසා තමන්ට සහ තම පවුලේ අයට සංක්‍රමණය වීමට සිදු වූ බව ද ගෘහවාසයන්ගෙන් අඩකට වඩා සංඛ්‍යාවක් සඳහන් කළහ. විශේෂයෙන් ම ත්‍රිකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්කයන්හි ද්‍රවිඩ සහ මුස්ලිම් ජනයා සම්බන්ධයෙන් ගත් කල මෙය ගැටුම නිසා ඇති වූ පොදු ප්‍රතිඵලයක් බැව් පෙනී ගියේ ය. රැකියා අවස්ථාවන් සීමිත ව පැවති ප්‍රදේශයේ ආර්ථික මන්දගාමීත්වය සමඟ මෙය වඩාත් ආසන්න ව බැඳී තිබුණා විය හැක. රැකියා අවස්ථා සොයා යෑමේ ශ්‍රමික සංක්‍රමණයට ගැටුම් නොපැවති කොළඹ වැනි නාගරික ප්‍රදේශ කරා සංක්‍රමණය වීම ඇතුළත් වූ අතර, වඩාත් සුලභ වූයේ මැද පෙරදිග වැනි විදේශ ගමනාන්තයන් කරා ඇදී යෑමය.

නැගෙනහිර පළාතේ දරිද්‍රතාවයෙන් සහ ගැටුමින් පීඩාවට පත් බොහෝ ජනයා ඒ දෙක අතර පවත්නා අන්‍යෝන්‍ය සම්බන්ධතාව සංජානනය කර තිබෙන බැව් ගෘහවාසයන් පිළිබඳ සමීක්ෂණයේ ප්‍රතිඵල මගින් පෙන්නුම් කෙරේ. දේපළ අහිමි වීම හෝ වේවා, අත්‍යවශ්‍ය භාණ්ඩ නොමැතිකම හෝ වේවා ඒ දෙකට ම හේතුව ගැටුම සහ දරිද්‍රතාව බැව් දක්වා ඇති ගෘහවාසයන් සංඛ්‍යාව පහත ඇති 3.3.1 වගුවෙන් දැක්වේ.

**වගුව 3.3.1 ගැටුම සහ දරිද්‍රතාව මගින් ඇති වන ප්‍රතිඵල**

| ගැටුමේ බලපෑම පිළිබඳ දර්ශකයන් | දරිද්‍රතාවේ බලපෑම පිළිබඳ සම්බන්ධතාව |
|---|---|
| දේපල අහිමි වීම (වත්කම්) | 91.6% |
| අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා ගැනීමට ඇති දුෂ්කරතා | 75.8% |
| ප්‍රවාහනයට ඇති දුෂ්කරතා | 68.3% |
| අධ්‍යාපනය කඩා කප්පල්වීම | 37.7% |
| පවුලේ සාමාජිකයකු අහිමි වීම | 2.7% |

*මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර දත්ත (ගෘහවාසයන් පිළිබඳ සමීක්ෂණය) 2004.*

ගැටුම හේතුවෙන් තම දේපල අහිමි වූ බව පළ කළ ගෘහවාසයන් අතුරින් 92% ක් පමණ ම තමන්ට සිදු වූ පාඩුවට හේතුවක් වශයෙන් දරිද්‍රතාව දක්වා ඇති බැව් ඉහත දැක්වෙන වගුව මගින් පෙන්නුම් කෙරේ. ඒ ආකාරයට ම, ගැටුම හේතුවෙන් තමන්ට අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා ගැනීමේ දුෂ්කරතා මතු වූ බව පළ කළ ගෘහවාසයන් අතුරින් 76% ක් ද එයට එක් හේතුවක් වශයෙන් දක්වා තිබෙන්නේ දරිද්‍රතාවයයි. එය ගැටුම සහ දරිද්‍රතාවය අතර පවත්නා සම්බන්ධතාව විදහා දක්වන්නක් වේ. ගැටුම නිසා ජනයා ඇතැම් ආකාරයන්ගෙන් ඍජු බලපෑමට ලක් වන අතර, ඒ හේතුවෙන් ඔවුන් වඩාත් දිළිඳු භාවයට පත් වේ. ඔවුන් වඩාත් දිළිඳු භාවයට පත් වූ කල්හි ගැටුමින් පැන නගින අහිතකර ප්‍රතිඵල හසුරුවා ගැනීම සහ එම ප්‍රතිඵලවල දැඩි බව තුනී කර ගැනීම ඔවුනට වඩාත් අසීරු වේ.

බොහෝවිට එකිනෙක හා බැඳුණු බහුවිධ ආකාරයන්ගෙන් ගැටුම ජනයා කෙරෙහි බලපා ඇති බව සමීක්ෂණය මගින් පෙන්වා දී ඇත. ගැටුමින් තමන් පීඩාවට පත් ආකාරයන් පහකට වැඩි සංඛ්‍යාවක් ගෘහවාසී ප්‍රතිචාරකයන් අතුරින් වැඩි පිරිසක් විසින් දක්වා තිබේ. ගැටුම හේතුවෙන් තම දේපල අහිමි ව ගිය බව පැවසූ අය ගැටුමේ ප්‍රතිඵලයක් වශයෙන් තමන් විස්ථාපනයට පත් වූ බව දැක්වීමට ද බෙහෙවින් ඉඩ තිබේ.

එබැවින් ගැටුම හේතුවෙන් ගෘහවාසයන් - ඒවා තුළ ජීවත් වන ළමුන් ද - විවිධ මට්ටමේ බලපෑම්වලට ලක්වීමට ඉඩ තිබෙන අතර ගැටුම පිළිබඳ එබඳු බලපෑම්වලට එකවිට විවිධ ස්වරූපයන් දැරීමේ හැකියාව තිබෙන බවද පෙනී යයි.

# 4. ළමුන් සහ සන්නද්ධ ගැටුම

මෙම අධ්‍යයනයෙහි අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ළමුන් ගැටුමින් පීඩාවට පත් ව ඇත්තේ කෙසේදයි යන්න අවබෝධ කර ගැනීමය. ගැටුම නිසා විශේෂයෙන් ම නැගෙනහිර පළාතෙහි ළමුන් සම්බන්ධයෙන් උද්ගත වූ ඉතාමත් ප්‍රකට බවට පත් අහිතකර ප්‍රතිඵලය වන්නේ සන්නද්ධ කණ්ඩායම්වලට, විශේෂයෙන් එල්ටීටීඊයට ළමුන් බලෙන් බඳවා ගැනීමය. මෙම කොටසෙහි අරමුණ වන්නේ යුද්ධයෙහි බෙහෙවින් ම වේදනාකාරී හෝ හානිකර ප්‍රතිඵල කවරේදැයි හඳුනා ගැනීම හෝ කිසියම් විශේෂිත ළමුන් පිරිසකගේ අත්දැකීම් කෙරෙහි අවධානය එල්ලකිරීම හෝ නොව, නැගෙනහිර පළාතේ වසන ළමුන් විශාල සංඛ්‍යාවකට අදාළ වන්නාවූ අවධානයට ලක් විය යුතු පොදු කරුණු හඳුනා ගැනීමය. ඒ අනුව, මතු දක්වෙන කොටස්වලින් ළමුන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් මෙන් ම, ළමා මෙහෙවරකම්, ළමා සෞඛ්‍යය, මාපිය රැකවරණය සහ ආධාරක පද්ධති ආදියට අදාළව ළමුන් මුහුණ පාන ගැටළු පිළිබඳ ව සොයා බලනු ඇත.

මෙම කොටස සඳහා කරුණු සපයා ගෙන ඇත්තේ ගෘහවාසයන් පිළිබඳ සමීක්ෂණවලින් මෙන් ම ළමුන් සමඟ පවත්වන ලද ගැඹුරු සම්මුඛ සාකච්ඡා මාර්ගයෙනි.

## 4.1 ගැටුම සහ අධ්‍යාපනය

ශ්‍රී ලංකාවේ මානව සංවර්ධනයෙහිලා නිදහස් අධ්‍යාපන ක්‍රමය මඟින් රටේ ඉදිරි ගමන උදෙසා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කර තිබේ. 90% කට අධික මෙරට සාක්ෂරතා ප්‍රතිශතය තවදුරටත් ඉහළ යමින් පවතින අතර, එය පිරිමින් සහ ස්ත්‍රීන් සම්බන්ධයෙන් එක හා සමාන ය. (ඩයස් බණ්ඩාරනායක, 2004). එතකුදු වුවත්, සෑම ළමයෙකුට ම අධ්‍යාපන ක්‍රමයට පිවිසීමේ වරම් එක හා සමාන ලෙස ලැබී නොමැත.

### *4.1.1 අධ්‍යාපන මට්ටම් සහ අධ්‍යාපනය හැර යන්නන්*

ළමුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ ව දනට තිබෙන ඉතාමත් මෑතකාලීන සමීක්ෂණය වන්නේ 1999 වසරේ ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණයයි. (ළක්‍රිස). එම සමීක්ෂණය උතුරු සහ නැගෙනහිර පළාත්වල හැර දිවයිනේ සෙසු සියලු පළාත්වල සිදු කර තිබේ. ළක්‍රිස මඟින් දක්වෙන්නේ 5 - 14 අතර වයස් සීමාවේ පසු වන ළමුන් අතුරින් 97% ක් මූලික වශයෙන් අධ්‍යාපනය ලැබීමේ නිරතව සිටින අතර 15 - 17 වයස් සීමාවේ පසුවන්නන් අතුරින් මේ ගණයට අයත් වන්නේ 71% ක් පමණක් බවය.[11] මින් අදහස් වන්නේ වැඩි වයස් කාණ්ඩයේ පසුවන සිසුන් අතුරින් සාපේක්ෂ වශයෙන් ඉහළ ප්‍රතිශතයක්, එනම්, 29% ක් විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියෙන් හැලී ගොස් ඇති බවය. අධ්‍යාපනය අතරමග නතර කර දැමීමට හේතුව වශයෙන් බොහෝවිට දක්වා ඇත්තේ ආර්ථික දුෂ්කරතාවන්ය. (ජන සංගණන දෙපාර්තමේන්තුව 1999).

*නැගෙනහිර පළාතේ පාසල් යන වයසේ (10 - 18 වයස් සීමාවේ) දරුවන්ගේ අධ්‍යාපන මට්ටම්*

10 - 18 වයස් සීමාවේ පසු වන නැගෙනහිර පළාතේ ළමුන්ගේ අධ්‍යාපන මට්ටම් සහ පාසල් හැරයෑමේ ප්‍රමාණයන් සමීක්ෂණයෙන් අනාවරණය වේ. පහතින් ඇති 4.1.1.1 වගුවෙන් දක්වෙන පරිදි, 10 - 14 අතර වයස් සීමාවන්හි පසු වන ළමුන්ගෙන් 89% කට ආසන්න ප්‍රමාණයක් සහ 15 - 17 වයස් සීමාවන්හි පසු වන ළමුන්ගෙන් 49% ක් පාසල් අධ්‍යාපනය ලබති. මෙකී ප්‍රතිශතයන් දිවයිනේ සෙසු පෙදෙස් සඳහා ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණ අධ්‍යයනයන්හි වාර්තා කර ඇති සංඛ්‍යාවන්ට වඩා පහතින් පැවතුන ද, ළක්‍රිස අධ්‍යයනයෙහි දී හඳුනාගත් ප්‍රවණතාවන් මෙම ප්‍රතිශත මඟින් ද තවදුරටත් සනාථ වේ. එනම්, අඩු වයස් ප්‍රමාණයන්හි ළමුන් වැඩි සංඛ්‍යාවක් පාසැල් අධ්‍යාපනය ලබන අතර අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දක්වා සහ ඊට ඉහළ අධ්‍යාපනය දිගට ම කර ගෙන යන්නේ ඊට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු සංඛ්‍යාවක් විසින් බව ය.

**වගුව 4.1.1.1. පාසැල්වල සිටින ළමුන්**

| වයස් කාණ්ඩය | පිරිමි | ගැහැණු | එකතුව | ළක්‍රිස |
|---|---|---|---|---|
| 10 - 14 වයස් | 87.9% | 89.1% | **88.6**% | 97% |
| 15 - 17 වයස් | 48.9% | 48.7% | **48.8**% | 71% |

*මූලාශ්‍රය:* ක්ෂේත්‍ර දත්ත (ගෘහවාසයන් පිළිබඳ සමීක්ෂණය) 2004.

[11] පහළොස් වන විය දක්වා අනිවාර්යෙන් පාසල් අධ්‍යාපනය ලැබීම ශ්‍රී ලංකාවෙහි පවත්නා අවශ්‍යතාවකි.


ඉහත වගුවෙන් දක්වෙන්නේ වයස 18 ට අඩු පාසැල් හැර යන සංඛ්‍යාවන්හි පිරිමි සහ ගැහැණු ළමුන් අතර සැලකිය යුතු වෙනසක් දක්නට නොමැති බවය. ඇත්ත වශයෙන්, අඩු වයස් කාණ්ඩයන්හි පිරිමි ළමුන්ට වඩා යම් ප්‍රමාණයකට වැඩියෙන් ගැහැණු ළමුන් පාසැල් යන බව පෙනේ. ජනවාර්ගිකත්වය සැලකිල්ලට ගත් කල්හි පෙනී ගියේ, ජනවාර්ගික කණ්ඩායම් තුනෙහි 10 - 14 අතර වයස් සීමාවෙහි පසු වන ළමුන් පාසැල් හැර ගොස් සිටීමට වඩා පාසැල් යමින් සිටින බවකි. 15 - 17 අතර වයස් කාණ්ඩයෙහි පසු වන ළමුන් පිළිබඳ චිත්‍රය ඊට වඩා වෙනස් ස්වරූපයක් ගනී. සිංහල ජනයා හැරුණු විට සෙසු ජනවාර්ගික කණ්ඩායම්වල පාසැල් යමින් සිටින ළමුන් හා සමාන සංඛ්‍යාවක් පාසැල් ගමන නවතා සිටිති.

සමස්තයක් වශයෙන් ගත් කල, 10 - 18 අතර වයස් කාණ්ඩයේ පසු වූ ළමුන් 599 දෙනා අතුරින් 70% ක් පමණ ම පාසැල් අධ්‍යාපනය ලබමින් සිටින බව වාර්තා වී ඇත. ඉන් 14% දෙනෙකු අධ්‍යාපනය ලබා ඇත්තේ වසර 5 ක් හෝ ඊට අඩුවෙන් වන අතර, ළමුන් 9 දෙනෙකු, එනම් නියැදියෙන් 1.5% ක් කිසිදු අධ්‍යාපනයක් ලබා නොමැති බැව් වාර්තා වේ.

*නැගෙනහිර පළාතේ 19-25 අතර වයස්වල යොවුන් වැඩිහිටියන්ගේ අධ්‍යාපනික ප්‍රාප්තිය (attainment)*

ගැටුම පවතින සමයේ පාසැල් සිසුන් වශයෙන් සිටි අය, එනම්, 19-25 අතර වයස් කාණ්ඩයේ පසුවන්නන් පිළිබඳ ව විමසා බැලීමෙන් තමන් ළඟා වූ අධ්‍යාපනික මට්ටම් කෙරෙහි ගැටුම කෙසේ බලපා ඇත්දැයි යන්න පැහැදිලි ව තේරුම්ගත හැක. මෙම වයස් කාණ්ඩයට අයත් අය තවදුරටත් පාසල් යමින් නොසිටින හෙයින් වත්මනේ පාසල් යන වියේ පසුවන ළමුන් සමඟ දර්ශක සැසඳීමක් කිරීම පිණිස ඔවුන්ගේ අධ්‍යාපනික ප්‍රාප්තියන් හෝ අධ්‍යාපනය ලද වසර ගණනාව හෝ උපයෝගී කර ගෙන තිබේ.

**රූපසටහන 4.1.1.2 19-25 අතර වයස් කාණ්ඩය සහ අධ්‍යාපනික ප්‍රාප්තිය**




*මූලාශ්‍රය:* සමීක්ෂණ දත්ත (ගෘහවාසයන් පිළිබඳ සමීක්ෂණය) 2004.

ඉහත රූපසටහනෙහි දක්වෙන පරිදි, මෙම වයස් කාණ්ඩයේ අය අතුරින් පස් වසරකට වඩා අඩු අධ්‍යාපනයක් ලබා ඇත්තේ 6% ක් පමණක් වන අතර, 36% ක් පාසල් ගොස් ඇත්තේ වසර 9 ක් හෝ ඊට අඩු ගණනකි. කෙසේ වුවද, සමස්තයක් වශයෙන් ගත් කල, 70% කට ආසන්න සංඛ්‍යාවක් වසර දහයක අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට පෙරාතුව (එනම්, අ.පො.ස. සා/පෙළ දක්වා) හෝ ආසන්න වශයෙන් වයස 17 ට පෙර පාසල හැර ගොස් තිබේ. යොවුන් වැඩිහිටියන් (එනම්, ගැටුම උච්ච ආකාරයට පැවති සමයේ පාසල් යමින් සිටි අය) අතර පාසල හැර යෑමේ ප්‍රමාණය, දැනට අඩු වයස් කාණ්ඩයේ පසු වන්නන් අතර දක්නට තිබෙන ප්‍රමාණයට වඩා තරමක් ඉහළ බැව් පෙනී යයි. ඉහත දී සඳහන් කළ පරිදි, 15 - 17 අතර වයස් කාණ්ඩයේ පසුවන්නන්ගෙන් තවදුරටත් පාසැල් නොගොස් සිටින්නේ අඩකට මඳක් වැඩි සංඛ්‍යාවක් වන අතර, 19 - 25 අතර වයස් කාණ්ඩයේ පසුවන්නන්ගෙන් 70% ක් 17 වන විය වෙත්දී පාසැල් යෑම නතර කොට තිබේ.

ස්ත්‍රීපුරුෂ සමාජභාවය සහ අධ්‍යාපනික ප්‍රාප්තිය සම්බන්ධයෙන් කිසියම් විෂමතාවක් පවතී. පස් වසරකට වඩා අඩුවෙන් අධ්‍යාපනය ලැබූ අය අතර පිරිමි ළමුන් මෙන් දෙගුණයක් වූයේ ගැහැණු ළමුන්ය. තමන් කිසිදු අධ්‍යාපනයක් නොලැබූ බව පැවසූ තිදෙනා ම ගැහැණු ළමුන් විය.

ජනවාර්ගික කණ්ඩායම් සහ දිස්ත්‍රික්කයන් අතර ද සැලකිය යුතු විෂමතාවන් දක්නට තිබුණි. අධ්‍යාපනික ප්‍රාප්තිය සමස්තයක් වශයෙන් සැලකීමේ දී සිංහල ප්‍රජාව, විශේෂයෙන් ම අම්පාර දිස්ත්‍රික්කයේ ජනයා (ඔවුන්ගේ 35% ක් පමණ ම සා/පෙළ දක්වා ද, 50% ක් උසස් පෙළ දක්වා ද අධ්‍යාපනය ලබා තිබීමෙන්) ද්‍රවිඩ සහ මුස්ලිම් ප්‍රජාවන්ට වඩා ඉදිරියෙන් පසු විය. සමස්තයක් වශයෙන් ගත් කල, සිංහල ළමුන්ගෙන් 86% කට වැඩි ප්‍රමාණයක් වසර 10 - 13 අතර ගණනක් පාසැල් අධ්‍යාපනය ලබා තිබූ අතර, 5 වසරට වඩා අඩු අධ්‍යාපනයක් ලබා තිබුණේ 1% කට අඩු සංඛ්‍යාවකි. එයට හාත්පසින් වෙනස් ආකාරයට, ද්‍රවිඩ සහ මුස්ලිම් ජනවාර්ගිකත්වයන්ට අයත් වූවන් අතුරින් වසර 10 - 13 අතර පාසැල් අධ්‍යාපනයක් ලබා තිබුණේ ඔවුන්ගෙන් අඩක පමණ සංඛ්‍යාවකි. මුස්ලිම් ජනයාගෙන් 10% ක් පමණ ලබා තිබුණේ පස් වසරකට වඩා අඩු අධ්‍යාපනයක් වන අතර, එම පිරිසට අයත් වූයේ ගැහැණු ළමුන්ය.

ජනවාර්ගික විවිධත්වය සහ දිස්ත්‍රික්කය තුළින් දිස්වන විෂමතාවන් ඇතැම්විට සාපේක්ෂ දරිද්‍රතාවට මෙන් ම ප්‍රචණ්ඩ ගැටුමට සාපේක්ෂ වශයෙන් ඇති ආසන්න බවට ද සම්බන්ධ කර දැක්විය හැක. අම්පාර දිස්ත්‍රික්කය තුළ ජීවත් වන සිංහල ජනයා භූගෝලීය වශයෙන් ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්ට තරමක් දුරකින් පිහිටි අතර, ඇත්ත වශයෙන් අම්පාර නගරයට කිසි විටෙකත් ප්‍රහාරයක් එල්ල වූයේ නැත. කෙසේ වුව ද, මෙම කරුණ වත්මන් අධ්‍යයනයේ විෂයපථයෙන් පරිබාහිර වූවක් වන අතර, මෙම විෂමතාවන් වැදගත් වේ ද, එසේ නම් ඒ කුමන හේතුවක් නිසා ද යන්න නිගමනය කිරීම උදෙසා වැඩිදුර පර්යේෂණ පැවැත්වීම ප්‍රයෝජනවත් වනු ඇත.

ළමුන් පාසැල හැරයන්නේ මක්නිසා දැයි යන්න පිළිබඳ ව ප්‍රශ්න කළ කල්හි, තරුණ වියේ දී පාසැල හැර යෑමේ හේතුව වශයෙන් බොහෝ විට දක් වූයේ දරිද්‍රතාවයයි.

> *"මම මගේ අධ්‍යාපනය නතර කරන්න තීරණය කළේ අපේ පවුල රැකබලා ගන්නත්, අපේ තාත්තා මළාට පස්සේ ගෙදරට හම්බ කරන්නත් කවුරුත් නොසිටි නිසයි."*
>
> (පිරිමි ළමයෙක්, වයස 24 කි; ද්‍රවිඩ)

වයසින් වඩා වැඩි ළමුන් අතර, සාමාන්‍ය පෙළින් පසුව බොහෝ දෙනා පාසැල් ගමන නවතා දමා තිබුණේ උසස් අධ්‍යාපනය හෝ වෘත්තීය පුහුණුව ලැබීම සඳහා අවශ්‍ය වූ අමතර වියදම දැරීමට අපොහොසත් වීමේ හේතුවෙනි. මෙම අධ්‍යාපන ආයතන බොහෝවිට ඔවුන්ගේ ගම් ආසන්නයෙහි පිහිටා නොතිබූ අතර, ඒ හේතුවෙන් වැඩිදුර ප්‍රවාහන සහ/හෝ නේවාසික වියදම් දැරීමට ඔවුනට සිදුව තිබුණි. ඇතැම් අවස්ථාවල දී වයසින් වැඩි ළමුන් කිසියම් අධ්‍යාපනික මට්ටමකට ළඟා වූ පසු පාසල හැර ගොස් තිබුණේ තම බාල සහෝදර සහෝදරියන්ට මූලික අධ්‍යාපනයක් ලබා දීමට ඉඩ සලසනු පිණිසය.

> *"අපි දෙන්නගෙ ම ඉගෙනීමේ වියදම් දරන්න අපේ දෙමාපියන්ට බැරි නිසා සාමාන්‍ය පෙළ විභාගෙන් පස්සෙ මගෙ නිඹුල් සහෝදරියට එයාගෙ පාසැල් ගමන නතර කරන්න සිද්ද වුණා. දෙමාපියන්ට ඕන වුනේ අඩු ගානෙ එක දුවකුට හරි උගන්වන්න - ඒ තමා මම."*
>
> (ගැහැණු ළමයෙක්, වයස 22 කි; මුස්ලිම්)

සෞඛ්‍යය, ආබාධිත බව සහ විවාහය වැනි වෙනත් බොහෝ කරුණු ද අධ්‍යාපනය නිසි කලට පෙරාතුව නතර කිරීමේ හේතු වශයෙන් දක්වන ලද නමුදු, ඒවා හේතු වශයෙන් දක්වා තිබූ වාර ගණන දරිද්‍රතාවට සහ ගැටුමට අදාළ හේතුවල සංඛ්‍යාවට වඩා බෙහෙවින් අඩු විය. ඇතැම්, ගම් කිහිපයක සහ සමහර ප්‍රජාවන්හි (මුස්ලිම් වැනි) ළමුන් පාසල් ගමන නතර කිරීමේ හේතු ලෙස දක්වා තිබුණේ සංස්කෘතික පරිපීඩනයන් සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ මුල්බැස ගත් පක්ෂග්‍රාහී මතයන් ය.

> *"මුදල් පිළිබඳ ප්‍රශ්න නිසා මගෙ සහෝදරියන්ටත්, මටත් පාසැල් ගමන නතර කරන්න සිද්ද වුණා. පාසල් යන්නෙ මගෙ මල්ලි විතරයි. මුල් තැන දීලා තියෙන්නෙ එයාට යි."*
>
> (ගැහැණු ළමයෙක්, වයස 19 කි; මුස්ලිම්)

පාසල් ගමන නතර කර නොතිබීමෙන් ඔවුන් ගුණාත්මක ආකාරයේ අධ්‍යාපනයක් ලබා සිටින බව හෝ ලබමින් සිටින බව හෝ අදහස් නොකෙරේ. මෙය තක්සේරු කිරීම සඳහා ඉහතින් දක් වූ සංඛ්‍යාවලින් ඔබ්බට ගොස් විමසා බැලීම අවශ්‍ය කෙරේ.

#### *4.1.2 අධ්‍යාපනයේ ගුණාත්මකභාවය*

ඉහළ ගුණාත්මක තත්වයෙන් යුත් අධ්‍යාපනයක් ලබා දීමට තරම් හිතකර පරිසරයක් ගැටුම් පවතින ප්‍රදේශයන්හි නොපවතී. ගැටුම් පවතින අවස්ථාවන්හි දී ආරක්ෂාව පිළිබඳ ගැටළු සහ ගමනාගමනය පිළිබඳ ඇති සම්බාධක නිසා පාසල් කරා යෑමේ බාධාවන් බොහෝවිට පැන නගී. ඇතැම්විට පාසල් ගොඩනැගිලි යුද්ධ හමුදාව හෝ සරණාගතයන් විසින් අත් කර ගෙන ඇත. ගැටුම පවතින ප්‍රදේශයන්හි විධිමත් පරිපාලන ව්‍යුහයන් ලිහිල් ව පැවතීමට ඉඩ තිබීමේ හේතුවෙන් පාසල් හැරයන්නන්ගේ ප්‍රමාණයන් පිළිබඳ එතරම් පාලනයක් නොපවතී. ආරක්ෂාව පිළිබඳ ගැටළු හේතුවෙන් ගුරුවරුන් සහ පාසල් කාර්යමණ්ඩලයේ වෙනත් අය සේවයට වාර්තා නොකිරීමට ඉඩ තිබේ. පාසල් දින ගණන අහිමි ව ගිය විට විෂයමාලාව සම්පූර්ණ කිරීමට ඉඩක් නොලැබෙන අතර, විභාග ද නියමිත කාලවල දී නොපැවැත්වීමට ඉඩ තිබේ.

> *"1995 - 2000 අතර කාලයේ යුද්ධයත්, කරදරත් නිසා පාසල දවස් ගණනක් ම වසා දමා තිබුණා. ගුරුවරු පාසල වහලා ළමුන් ඒ අයගේ දෙමාපියන්ට බාර දුන්නා."*
>
> (පිරිමි ළමයෙක්, වයස 20 කි; සිංහල)

නැගෙනහිර පළාතේ සුලභ සිදුවීම් වශයෙන් දැකිය හැකි හර්තාල්[12] සහ ඇඳිරි නීතිය පැනවීම ළමුන්ගේ පාසල් යෑම පිළිවෙලකට සිදු නොවීමට හේතු වන්නට ඇත. ප්‍රවාහන ගැටළු සහ ගමනාගමනය පිළිබඳ සීමිතභාවයන් ද තම පාසැල් ගමන වළකා ලූ බැව් ළමුන් විසින් දක්වන ලදී. සටන් වැද සිටින පාර්ශවයන්ගේ ඉලක්ක බවට පත්වෙතැයි දෙමාපියන් තුළ වූ බිය ද පාසල් යැවීමෙන් ළමුන් අවදානමට ලක් කිරීමට වඩා ඔවුන් ගෙදර රඳවා ගෙන සිටීමට හේතු වී තිබේ. බොහෝ අවස්ථාවල ළමුන් පාසල් ගියේ තනිව ම නොවේ. ඔවුන් එසේ ගියේ කණ්ඩායම් වශයෙන් සැදී හෝ තම පියා වැනි වැඩිහිටියෙකු ද සමඟය. ඒ ආකාරයට සංවිධානය වීමට බැරි වූ දිනවල ළමුන් පාසල් නොගොස් සිටීමට ඉඩ තිබුණි.

> *"පහර දීමක් ගැන අපේ තාත්තට දැන ගන්න ලැබුණු හැම දවසක ම ඔහු මට පාසල් යන්න ඉඩ දුන්නෙ නැත්තෙ වෙඩි තියා ගැනීම්වලට මාව මැදි වේවි කියන බයටයි."*
>
> (ගැහැණු ළමයෙක්, වයස 20 කි; මුස්ලිම්)

ගැටුමේ ඍජු බලපෑම්වලට අමතර වශයෙන්, ඌන සංවර්ධිත යටිතල පහසුකම් සහ පිළිවෙලකින් තොර හෝ සීමිත ප්‍රවාහන පහසුකම් වැනි වක්‍ර හේතූන් ද ළමුන්ගේ පාසැල් ගමනට ගැටළු ඇති කළේය.

> *"ගමේ පාසලේ උගන්වන්නේ සාමාන්‍ය පෙළ දක්වා පමණයි. උසස් පෙළ පංතිවලට මට කිලෝමීටර් 2 ක් දුරින් තියන වෙන්ගලඩිවලට යන්න සිද්ද වෙනවා. මම යන්න ඕනෙ බයිසිකලෙන්. බස් ගාස්තුව රුපියල් පහ වුනත් බස් එක පාසල ළඟට යන්නෙ නෑ."*
>
> (ගැහැණු ළමයෙක්; වයස 16 කි; ද්‍රවිඩ)

පාසැලට යෑම පිළිබඳ ව පැන නැගී ඇති ගැටළුවලට අමතර ව පුස්තකාල, රසායනාගාර සහ වෙනත් පහසුකම් නොමැති වීම සහ සුදුසුකම් සහිත ගුරුවරුන් නොමැති වීම වැනි තම පාසල්වල පවතින සීමිත සම්පත් ගැන ද ළමෝ කරුණු දැක්වූහ. ප්‍රදේශයේ පාසල් කිහිපයක ම පන්ති තිබුණේ 9 වන හෝ 11 වන වසර දක්වාය. උසස් පෙළ පන්ති ඇති අවස්ථාවල ඒවා සාමාන්‍යයෙන් සීමා වී තිබුණේ කලා අංශයට පමණකි. බොහෝ ළමුන්ට තම අධ්‍යාපනය සම්පූර්ණ කර ගැනීම පිණිස නාගරික ප්‍රදේශවල හෝ විශාල ගම්වල පිහිටි වඩාත් උසස් පාසල් කරා යෑමට සිදු විය. මෙහි දී ගමනාගමනය සඳහා අමතර වියදම් දැරීමට ද, වැඩිපුර කාලයක් ගත කිරීමට ද සිදු වන හෙයින්, මෙම විකල්පයන් බොහෝ විට සාධනීය වී නොමැත.

---

12 කඩසාප්පු, පාසල්, සේවාස්ථාන වසා දමා අඩපණ වූ ප්‍රවාහන සේවාවන් සහිත ව පවත්වන මහජන විරෝධය පළකිරීමක් හර්තාලය යනුවෙන් අදහස් කෙරේ.

*"මට වුනේ (පාසලේ) තියන දේ ඉගෙන ගන්නයි. ඒ කීවෙ කලා විෂයන්. තර්ක ශාස්ත්‍රය මට හුඟක් අමාරු වුණා. ඒ නිසයි මට උසස් පෙළ සමත් වන්න බැරි වුණේ. මම තර්ක ශාස්ත්‍රයෙන් අසමත්."*

(පිරිමි ළමයෙක්, වයස 21 කි; ද්‍රවිඩ)

පවත්වන ලද ගුණාත්මක සම්මුඛ සාකච්ඡාවල දී යොවුන් වැඩිහිටියන් පළ කළේ තමන්ට සාමාන්‍ය පෙළින් අනතුරුව අධ්‍යාපනය ඉහළට කර ගෙන යෑමට නොහැකිවීමට දරිද්‍රතාව ළඟට දෙවැනියට තුඩු දුන් ඉතාමත් පොදු හේතුව වූයේ ඒ සඳහා අවශ්‍ය ශ්‍රේණි හෝ ප්‍රතිඵල ලබාගත නොහැකිවීම බවය. මෙයට හේතු වී ඇත්තේ සිසුවාගේ හැකියාවන්හි මඳකම පමණක් නොව අඩු ගුණාත්මක බවින් යුත් අධ්‍යාපනයයි.

*"මගේ සාමාන්‍ය පෙළ ප්‍රතිඵල උසස් පෙළ ඉගෙනුම කරගෙන යන්න තරම් ප්‍රමාණවත් වුණේ නෑ. ඒ පාර මම මගේ ඉගෙනීම නතර කරල දාලා තාත්තාගෙ ව්‍යාපාරයට එකතු වුණා."*

(පිරිමි ළමයෙක්, වයස 21 කි; මුස්ලිම්)

ගැටුම් පවතින කාලවල නිරතුරුව සිදුවූ විස්ථාපනයන් හේතුවෙන් ද ළමුන්ගේ අධ්‍යාපනයට බලපෑම් එල්ල වී ඇත. එක් රැයක සිට මාස ගණන් දක්වා කාලවල් තුළ කැළෑවේ සැඟවී සිටීමට තමන් සිදු වූ වාර ගණන් පිළිබඳ ව ළමුන් බොහෝ දෙනෙකු විසින් විස්තර කරන ලදී. ඒ කාලවල දී ඔවුන්ගේ අධ්‍යාපනය මුලුමනින් කඩා කප්පල් වී තිබේ. සරණාගත කඳවුරුවල දිගු කලක් විසීමට සිදු වූ ඇතැම් ළමුන්ට සිදු වූයේ විස්ථාපනය වී සිටිමින් තාවකාලික පාසල්වලට යෑමටය. එසේ වුව ද, කඳවුරු පරිසරය ඉගෙනුම ලැබීමට මෙන් ම ඉගැන්වීමට ද සැමවිට ම හිතකර වූවක් නොවීය.

*"1990 දී අපි අවුරුදු තුනක් (අනාථ) කඳවුරක හිටියා. කඳවුරේ ඉන්න අතරෙ අපි ප්‍රශ්නයක් නැති ව අපේ අධ්‍යාපනය දිගට ම කර ගෙන ගියත් ඒ කාලෙ දි ඉගෙනුම ලබන්න අමාරු වුණා."*

(පිරිමි ළමයෙක්, වයස 23 කි; ද්‍රවිඩ)

ළමුන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල ජීවිත මෙලෙස කඩාකප්පල් වීමත්, තමන්ට හුරුපුරුදු දේ අහිමි ව යෑමත් නිසා ළමුන් තුළ හානිකර චිත්තාවේගාත්මක ප්‍රතිඵල ඇති විය හැක. මින් ඉගෙනුමට දක්වන උදාසීනත්වය, කිසිවක් වැඩි කල් නොපවතින තත්වයක් තුළ යමක් තාවකාලික ව ලබා ගැනීමට සිතීම වැනි වෙනත් ප්‍රතිවිපාක රැසකට මං පෑදීමට ඉඩ තිබේ. අනාරක්ෂිත බව සහ බිය පිළිබඳ පවතින සාමාන්‍ය තත්වයන් පාසැල් යෑම කෙරෙහි ළමුන් තුළ ඇති චිත්ත ඒකාග්‍රතාවයට ද, අවසානයේ දී ඔවුන් ලබන අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවයට ද බල පෑ හැක (අංක 1 දරන කොටුව බලන්න.).

**කොටුව 1: "අපිට ලයිට් දාගෙන රෑට පාඩම් කරන්න බැරි වුණා."**

වෙනත් පවුල් කිහිපයක් ද සමඟ හවුලේ වැඩ කළ අක්කර කාලක ගොවිපලක් ගයත්‍රිගේ[13] පවුලට තිබූ අතර ඔවුන් තම ආදායම පිළිබඳ අඟහිඟකම් පිරිමසා ගත්තේ ගඩොල් කැපීමෙන් සහ කුලී වැඩ කිරීමෙනි. ඇය අ.පො.ස. උසස් පෙළ විභාගය අවසන් කළා පමණකි.

ගැටුම් පැවති වසරවල දී ඇගේ ගම මහත් ප්‍රචණ්ඩත්වයන්ට ගොදුරු විය. එය අම්පාර දිස්ත්‍රික්කයේ සිංහල සහ ද්‍රවිඩ ජන කොටස් වෙන් කරන මායිමේ පිහිටා තිබීම ගැමියන්ට ඉමහත් දුෂ්කරතාවයන් ඇති කරන්නක් විය. 1990 වසරේ සිට 2000 දක්වා ඔව්හු බෙහෙවින් අවිනිශ්චිත ජීවිතයක් ගත කරමින් සිදු විය හැකි ප්‍රහාරයන්හි සෝෂා ගැන නිරතුරු ව සෝදිසියෙන් පසු වූහ. ආහාර ගැනීම, පිසීම වැනි දේ කරමින් සිටින අතරවාරයේ දී තමනට රෑ කල කැළෑ වැදීමට හෝ ඇතුළට වන්නට පිහිටි සිංහල ගම් කරා ඇදී යෑමට සිදුවූ බොහෝ අවස්ථාවන් පිළිබඳ ව ඔවුහු පැවසූහ. වසර ගණනාවකින් ගයත්‍රිගේ පවුලට තම නිවසෙහි එකදු රැයක්වත් ගත කිරීමට නොහැකිව තිබූ අතර, ඔවුන් ඒ වෙනුවට නිදා ගැනීමට ගොස් තිබුණේ ගම ඇතුළට වන්නට පිහිටා තිබූ ඥාතියෙකුගේ නිවසටය.

ගයත්‍රි පැවසුවේ යුද්ධය නිසා තම ජීවිතයෙන් වැඩි කාලයක් නිසි ලෙස පාඩම්වල යෙදීමට තමාට නොහැකි වූ බවය. කිසිදු ළමයෙකුට රාත්‍රියේ දී තම පාඩම්වල නිරත වීමට නොහැකි වූයේ පහන් දල්වා ගෙන සිටීමට ඔවුන් බිය වූ හෙයිනි. නිවසේ දී මෙන් ම පාසලේ දී තමා නිරතුරුව බියෙන් පෙළෙන්නට වූ ආකාරය ගැන ගයාත්‍රි විස්තර කළාය.

---

13 ප්‍රතිචාරකයාගේ නිර්නාමික බව රැක ගනු වස් නම වෙනස් කර ඇත.

## 4.2 ගැටුම සහ ළමා කායජීයන්

ඉහත සඳහන් කරන ලද ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණය (ළක්‍රිස) ශ්‍රී ලංකාවේ ළමුන් අතුරින් විශාල සංඛ්‍යාවක් අධ්‍යාපනය ලැබීමට පරිබාහිරව වෙනත් ක්‍රියාකාරකම්වල නිරතව සිටින බව වාර්තා කර ඇත. ගෙදරදොරේ වැඩ, පවුලේ ආදායම් ඉපදවීමේ වැඩවලට උදව් වීම පිණිස පඩිරහිත ව වැඩ කිරීම සහ පඩි ලබන වැඩවල නිරත වීම වැනි ළමුන් නිරතවෙන වෙනත් ක්‍රියාකාරකම් වලට බලපෑමක් ගැටුම මගින් ඇති කරන ලද්දේ ද යන්න අවබෝධ කර ගැනීම පිණිස මෙම කොටසින් නැගෙනහිර පළාතේ පවතින තත්වය විමසා බැලීමට ලක් කෙරේ. මෙම කොටසෙහි අරමුණ වන්නේ ගැටුම මෙන් ම දරිද්‍රතාව ළමුන් කරන කාර්යයන් කෙරෙහි බල පෑ හැකි ආකාරය හඳුනා ගැනීමයි.

සැහැල්ලු වැඩ ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බලපාන අවම වයස අවුරුදු 15 වන නමුදු[14] වයස 5 - 14 අතර කුඩා ළමුන්ගෙන් 90% ක තරම් ප්‍රමාණයක් පාසැල් යන අතරවාරයේ ම "කිසියම් ආකාරයක ආර්ථික ක්‍රියාකාරකම්වල යෙදී සිටින බව" ළක්‍රිස වාර්තා කරයි. (ජ. ස. දෙ. 1999:11) උතුර සහ නැගෙනහිර හැර දිවයිනේ සෙසු පළාත් සියල්ලෙහි සිදු කරන ලද සමීක්ෂණය මගින් පෙන්වා දෙන්නේ පාසැල් යන අතර ම ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත ළමුන් අතුරින් 74% කට ආසන්න සංඛ්‍යාවක් කෘෂිකාර්මික කටයුතුවල නිරත ව සිටින බවකි. මෙම වයස් කාණ්ඩයට ගැනෙන ඉතා සුළුතරයක් - 1% කට අඩු සංඛ්‍යාවක් - තම මුලු කාලයම ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත ව සිටිති; එනම්, පාසල් කටයුතු, ආර්ථික කටයුතු සමඟ අනුබද්ධ කර ගෙන නොමැති බවයි. එසේ වුව ද, 15 - 17 වයස් කාණ්ඩයේ පසුවන්නන්ගෙන් පාසල් යන අතරතුර ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත ව සිටින්නේ සාපේක්ෂ වශයෙන් 30% ක් තරම් සුළු ප්‍රමාණයකි. 2003/04 වසරේ පාරිභෝගික මූල්‍ය පරිහරණය සහ සමාජ - ආර්ථික සමීක්ෂණයේ (පාමුස) මූලික සොයා ගැනීම්වලට අනුව, 14 - 18 වයස් කාණ්ඩයේ පසුවන්නන්ගෙන් 35% ක් රැකියාවන්හි නියුක්ත ව සිටින අතර[15] 19 - 25 අතර වයස් කාණ්ඩයේ අයගෙන් එසේ රැකියාවල නියුක්තව ඇතැයි සලකා ඇත්තේ 28.6% ක් පමණකි. (ඩයස් බණ්ඩාරනායක 2004).

නැගෙනහිර පළාතේ ද තම ගෘහවාසයන්හි ආර්ථික කටයුතු වෙනුවෙන් ළමුන් බොහෝ ආකාරවලින් දායක වන බැව් ගෘහවාසයන් පිළිබඳ සමීක්ෂණයේ ප්‍රතිඵලවලින් දක් වේ. සමීක්ෂණයට භාජන කරන ලද සෑම නිවෙසක ම පාහේ ළමුන් පඩි නොලබන නමුත්, කිසියම් ආකාරයකින් පවුලේ වැඩකටයුතු සඳහා යොදවා ගෙන තිබුණි. ගැහැණු ළමුන් බහුල වශයෙන් යොදවා ගනු ලැබ තිබුණේ ආහාර පිසීම, ශුද්ධ පවිත්‍ර කිරීම, දරුවන් බලා ගැනීම වැනි ගෙදරදොර වැඩ කටයුතුවලටය. පිරිමි ළමුන් ඉතා වැඩි වශයෙන් සිය දායකත්වය පිරි නමා තිබුණේ ගෙවත්තේ වැඩ කිරීම සහ පශු සම්පත් කළමනාකරණයට උදව් වීම මගිනි. ළමුන්ගේ ක්‍රියාකාරකම් ස්ත්‍රීපුරුෂ සමාජභාවය අනුව දැඩි සීමාවලින් බෙදා වෙන් කර නොතිබුණ ද ළමුන් බලා ගැනීම සහ ආහාර පිසීම බහුල වශයෙන් සිදු කරන ලද්දේ ගැහැණු ළමුන් විසිනි.

> *"සුමානෙකට දවස් පහක් මම නගරෙ ටියුෂන් පන්තියකට යනවා. අනිත් දවස්වල මම අපෙ අම්මට ගෙදර වැඩවලට උදව් වෙනවා. මම හැමදාම බත් උයනවා."*
>
> (ගැහැණු ළමයෙක්, වයස 15 කි; මුස්ලිම්)

තමන් කරන වැඩ පිළිබඳ ව ළමුන්ගෙන් ඇසූ ඍජු ප්‍රශ්නවලට ලද පිළිතුරුවලින් ඔවුන් කරන ගෙදරදොරේ වැඩවල පරාසයන් පිළිබඳ ඉඟියක් ලැබුණ ද, එම වැඩවල ප්‍රමාණය කොතෙක්දැයි යන්න සැමවිට ම පැහැදිලි නොවීය. ළමුන් සමඟ පැවැත්වූ සාකච්ඡාවල දී ගෙදර වැඩට නියැලීම සඳහා ගත කරන නියම කාල ප්‍රමාණය හෙළිදරව් කර ගැනීම පිණිස ඔවුන් එදිනෙදා කරන වැඩ කටයුතු පිළිබඳ ව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.

---

14 ළමා ශ්‍රම ගැටළුවලට අදාළ සියලු ම ප්‍රධාන සම්මුති සහ නියමයන්ට (අවම වයස් අවශ්‍යතාව පිළිබඳ ජාකස 38 සහ ඉතාමත් අයහපත් ආකාරයන්හි ළමා ශ්‍රමය, ජාකස 192) මෙන් ම 1990 ළමා අයිතීන් පිළිබඳ සම්මුතියට සහ සන්නද්ධ අරගලයෙන් හානියට පත් ළමුන් පිළිබඳ විකල්ප සන්ධානයටත් අත්සන් තබා ඇති හෙයින් ඒවායේ ගැබ් වන රෙගුලාසි බලගැන්වීමට ශ්‍රී ලංකාව බැඳී සිටී.

15 2003/04 පාමුස මගින් දක්වෙන්නේ "අදාළ කාලසීමාව තුළ පැයකට වැඩි කාලයක් සේවකයෙකු ලෙස වැඩෙහි නිරත වන ගෘහවාසී සාමාජිකයෙකු සලකා ඇත්තේ වේතන ලබන සේවකයෙකු, සේවා යෝජකයෙකු, තමාගේ ම වැඩක නිරතවන්නෙකු (ස්වයං රැකියාවක නිරත වූවෙකු) හෝ වේතන නොලබන පවුලේ සේවකයෙකු, රැකියාවක නියුක්ත වූවෙකු වශයෙනි" යනුවෙනි. (ඩයස් බණ්ඩාරනායක, 2004:7)

*"මගෙ සාමාන්‍ය පෙළ විභාගයට තව ඇත්තෙ මාස තුනක් විතරක් නිසා සැමදාම පැය 2 - 3 ක් විතර පාඩම් කරන්න මම උත්සාහ ගත්තා. අපෙ අම්මා ඉන්නෙ මැද පෙරදිග හින්දා උදේට, දවල්ට, රෑට ඉවුම්පිහුම් කරන එක, ගෙදර සුද්ධ කරලා අතු ගාන එක, බොන්න වතුර ගේන එක වගේ සේරම ගෙදරදොරේ වැඩ කරන්නෙ මමයි. පාසැල් යන දවස්වලට මම පාන්දර 4 ට නැගිට්ටා ම නින්දට යන්නෙ රෑ 11 ටයි."*

(ගැහැණු ළමයෙක්, වයස 16 කි; සිංහල)

තම කාලයෙන් වැඩි කොටසක් නිවසේ වැඩට යෙදවීමට සිදුව ඇති හෙයින් මෙම ළමයාට තම අධ්‍යාපන කටයුතු සඳහා සෑම දිනකම වැය කිරීමට ඇත්තේ ඇත්ත වශයෙන් ම පැයකට අඩු කාලයකි. ළක්‍රිස දත්ත මඟින් දක්වෙන අන්දමට ශ්‍රී ලංකාවේ ළමුන් බොහොමයක් තම ගෙදරදොරේ වැඩවල නිරත ව සිටින අතර, නැගෙනහිර පළාතේ ළමුන් ද තම කාලයෙන් ඉතා වැඩි ප්‍රමාණයක් සිය ගෙදරදොරේ වැඩ සඳහා යොදවන බැව් පෙනී යාමෙහි විශේෂ අමුත්තක් නැත. කෙසේ වුව ද. ළමුන්ගේ ඉගෙනුමට සහ වර්ධනයට බාධා ඇති නොවීම සහතික වනු වස් මෙම වැඩකටයුතු අතර මනා සමබරතාවයක් පවත්වා ගෙන යෑම අත්‍යවශ්‍ය වූවකි.

ළමුන් අතුරින් ඉතා වැඩි පිරිසක් ගෙදරදොරේ වැඩ සහ තම ඉගෙනීමේ කටයුතු අතර දෝලනය වෙමින් සිටින අතර, ළමුන් කිහිප දෙනෙක් වේතන ලබන වැඩ සමඟ ම තම අධ්‍යාපන කටයුතු ද කර ගෙන යන ආකාරය පිළිබඳ ව සඳහන් කළහ. තම පවුලේ ආදායමට යමක් එක් කරන අටියෙන් අස්වනු නෙළන සමයේ දී ඊට උදව් වීම සහ ටියුෂන් පන්ති පැවැත්වීම වැනි වැඩ වයසින් වැඩි ළමුන් අතර සුලභ බැව් ඔවුන් කළ සඳහන්වලින් පෙනී ගියේය.

*"මගෙ ඥාති සහෝදරයෙක් කාර්මික ශිල්පියෙක්. මම සමහරදාට ගිහින් එයාට උදව් වෙනවා. එයා මට දවසකට රු. 200 - 300 අතර ගානක් ගෙවනවා. මම ඒක මගෙ පොත් මිල දී ගන්න යොදා ගන්නවා."*

(පිරිමි ළමයෙක්, වයස 21 කි; ඌව්ඩ)

ඇතැම් ළමුන් වේතන ලබන වැඩවල පූර්ණකාලීන ව නිරත ව සිටින නිසා, ඔවුහු තවදුරටත් පාසල් නොයති. සමීක්ෂණයට භාජන කරන ලද සෑම ගෘහවාසයන් තුනකින් ම යටත් පිරිසෙයින් එක ළමයෙකු බැගින් හෝ ආදායම් උපදවන පූර්ණකාලීන ක්‍රියාකාරකමක නිරත ව සිටියේය. වැඩවල යෙදී සිටින ළමුන් අතුරින් වැඩි පිරිසක් පාසල් හැර ගිය අඩු සුදුසුකම් සහිත අය වූ හෙයින් ඔවුන්ට නිරත වීමට සිදු ව තිබුණේ කුලී වැඩකරුවන් වැනි අඩු කුශලතාවක් අවශ්‍ය පහළ මට්ටමේ වේතන ලබන රැකියාවලය.

ගෘහවාසයන් වැඩි සංඛ්‍යාවක ප්‍රතිචාරකයන් විසින් පවසන ලද්දේ ළමුන් වේතන ලබන රැකියා සොයා ගොස් ඇත්තේ ගැටුම හේතුවෙන් පවුලේ මූලික ආදායම් උපයන්නා අහිමි වීම බඳු ගැටුම සහ දරිද්‍රතාව යන කරුණු සමඟ ඈඳුණු හේතු නිසා බවය.

*"අපේ තාත්තා යුද්දෙන් මැරුණා. මට කොළඹ කිට්ටුව පාසලකට යන්න ශිෂ්‍යත්වයක් ලැබුණා. ඒත් එක පාරක් මම නිවාඩුවට ගෙදර ආ වෙලාවෙ මගෙ අම්මාගෙත්, සහෝදරියගෙත් තත්වය දැකල මම පාසල් ගමන නතර කරලා ගෙදර නතර වෙන්න තීරණය කළා."*

(පිරිමි ළමයෙක්; වයස 22; මුස්ලිම්)

පාසල් ගමන අතරමඟ නතර කළ ළමුන් පැවසුවේ කුලී වැඩකරුවන් වශයෙන් හැර වෙනත් රැකියාවක් සොයා ගැනීම තමනට අසීරු බවය. ඇතැම් ළමුන්ට කිසිදු වැඩක් සොයා ගත නොහැකි ව ගෙදරට වී නිකම් බලා සිටිමට සිදුව ඇත. එසේ වුව ද, පාසල් හැර ගොස් වේතන ලබන රැකියා කිරීමට පටන් ගෙන නව කුශලතාවන් ඉගෙනුමෙන් සැලකිය යුතු සම්පත් සහිත තත්වයන් උදා කරගෙන සිටි සහ ඇතැම් විට තමන්ගේ ම ව්‍යාපාර අරඹා සිටි ළමුන් පිළිබඳ බොහෝ අවස්ථා ද පර්යේෂණ කණ්ඩායමට හමු විය. (අංක 2 දරන කොටුව බලන්න). වෙහෙස දරා වසර ගණනාවක් වැඩ කිරීමෙන් පසු ස්ථාවර ආදායම් මාර්ග හදා ගත් අය, තම අධ්‍යාපනය අඛණ්ඩ ව කරගෙන නොයෑම ගැන පසුතැවිලි වන බවක් දක්නට තිබුණේ නැත.

**කොටුව 2: "මගෙ මුල් ම රැකියාවෙන් ලැබුණෙ මාසෙට රු. 200 යි"**

කුමාරට[16] වයස අවුරුදු 10 කාලෙ දී ඔහුගෙ පියා අතුරුදහන් වුණා.

යුද්ධයට කලින් කුමාරලගෙ පවුල සාමාන්‍යයෙන් සරුසාර ජීවිතයක් ගත කළා. ඔවුන්ට කුඹුරු අක්කර හතරක් තිබූ අතර ඔහුගෙ පියාට බර කරත්තයක් ද තිබිණි. ඔහුගෙ පියාට දිනක් ගල් වගයක් ප්‍රවාහනය කර දෙන ලෙස එල්ටීටීඊය විසින් බලකරන ලද බැව් ඔහු පැවසීය. ඉන් මද වේලාවකට පසු යුධ හමුදවෙන් පැමිණ ඔහු රැගෙන ගියේ එල්ටීටීඊයට ඔහු සේවය කරන බවට සැක කරමිනි. ඔහුගේ පවුලේ අයට ඉන්පසු ඔහු දක ගන්නට නොලැබුණු අතර ඔවුන්ගේ සැකය වූයේ යුධ හමුදව විසින් ඔහුව ඝාතනය කර ඇති බවයි.

තම පියාගේ අතුරුදහන් වීමෙන් තෙවසරකට පසු පාසැලෙන් අස් වී රැකියාවක් කිරීමට කුමාර අදහස් කළේය. තම මිතුරෙකුගේ මාර්ගයෙන් ඔහු සොයා ගත් මුල්ම රැකියාව වූයේ මසකට රුපියල් 200/- ක පඩියක් ගෙවන කුලී වැඩකි. ඉන්පසු කුඩා කඩයක් ඇරඹූ ඔහු වසර 5කින් පසු එය පොත්හලක් දක්වා දියුණු කර ගැනීමට සමත් විය. අද කුමාර සහ ඔහුගේ සොහොයුරා කුඩා වුව ද භාණ්ඩවලින් පිරුණු ඕඩියෝ/වීඩියෝ හලක් පවත්වා ගෙන යන අතර එහි සංයුක්ත පට තැටිගත කිරීම මෙන් ම වීඩියෝ පටිගත කිරීම ද සිදු කෙරේ. ඔහු බැංකු ණයක් ලබාගෙන, තම ඉඩමේ තවත් නිවසක් ගොඩ නගා ගෙන යන අතර එය ජලය, විදුලිය සහ වැසිකිළි පහසුකම්වලින් ද සමන්විත වනු ඇත. පාසැලින් අස් වීමට සිදු විම ගැන තමා කිසි විටෙකත් පසුතැවිලි නොවන බව පවසන ඔහුගේ හැඟීම වන්නේ පාසලේ රැඳී සිටියේ නම් තමාට කිසි දිනෙක මෙම තත්වයට ළඟා විය හැකි නොවන බවය.

ඒ අතර ම අධ්‍යාපනය සම්පූර්ණ කිරීම වෙනුවෙන් තම සම්පත්, කාලය සහ ප්‍රයත්නය වැය කර රැකියා නියුක්තිය සලසා ගැනීමට නොහැකි වූ අය ද සිටියහ. ඉහතින් ද සඳහන් කළ පරිදි, පළාතේ ඇති ආර්ථික ක්‍රියාකාරකම් සීමිත වන අතර අවබෝධතා ගිවිසුම වසර දෙකක් පුරා ක්‍රියාත්මක ව පැවතීමෙන් අනතුරු ව වුව ද ප්‍රදේශය මුලුමනින් යහපත් අතට හැරී නැත. ඇතැම් යොවුන් වැඩිහිටියන් දක්වූයේ වසර 13 ක් පුරා අධ්‍යාපනය ලැබීමෙන් පසු පවා සහ ඇතැම් අය උසස් පෙළ සමත් වීමෙන් පසු පවා කුලී ශ්‍රමිකයන් වශයෙන් වැඩ කිරීම හැරෙන්නට වෙනත් රැකියා අවස්ථා තමන්ට තවමත් ලැබී නැති බවය.

> *"වැදගත් අය සමඟ සම්බන්ධකම් නැත්නම් රැකියාවක් ලබා ගන්න අමාරුයි. රාජ්‍ය නොවන සංවිධාන වැඩ දෙනවා වුනත් ඒ ස්වේච්ඡා සේවකයන් හැටියට විතරයි. ස්වේච්ඡා වැඩ කිරීමට තරම් ආර්ථික තත්වයක් මට ඇත්තෙ නෑ."*
>
> (ගැහැණු ළමයෙක්; වයස 21 කි; දුවිඩ)

තමන් සතු සම්පත්වල ඌනතාවය හේතුවෙන් ප්‍රදේශයෙන් බැහැර ගොස් රැකියා අවස්ථා සොයා බැලීමට මෙම පිරිස්වලට ඇති ඉඩකඩ සීමිතය. වැඩ කිරීමේ අවස්ථා සොයා බැලීම පිණිස නගරයකට හෝ කොළඹ වැනි පුරවරයකට යෑමේ දී දැරීමට සිදු වන වියදම් (ප්‍රවාහන සහ නවාතැන්) පිළිබඳ ව ප්‍රතිචාරකයන් විසින් කරුණු දක්වන ලදී. දිවයිනේ සෙසු පෙදෙස් සමඟ සමාජ ජාල පවත්වා ගෙන ගිය පවුල් අතලොස්සකට තම ළමයෙක් හෝ යොවුන් වැඩිහිටියෙක් එම නෑදැයින් හෝ මිතුරන් සමඟ විසීම පිණිස යැවීමට හැකි වූ අතර, එසේ ගිය අය නාගරික පෙදෙස්වල වැඩෙහි නිරත වීමට ඇති අවස්ථා පිළිබඳ ව සොයා බැලුහ.

ළමුන් සහ යොවුන් වැඩිහිටියන් විශාල සංඛ්‍යාවක් අතුරින් සමහරු තම අධ්‍යාපන මට්ටමට නොසරිලන ආකාරයේ වැඩවල නිරතව සිටි අතර තවත් සමහරු කිසිදු වැඩක නිරත ව සිටියේ නැත. ස්වකීය අධ්‍යාපනය නිම කරන ළමයෙකුට හිමි වන මෙම පහත් මට්ටමේ ආදායම් තත්වය ගැන ප්‍රතිපත්ති සම්පාදන කවයන්හි අවධානය යොමු විය යුත්තේය.

## 4.3 ගැටුම සහ සෞඛ්‍යය

දිගු කාලසීමාවල් තුළ පවතින සන්නද්ධ ගැටුම ළමුන්ගේ සෞඛ්‍ය තත්වය කෙරෙහි ද බලපා තිබේ. දනට ඇති දත්තවලින් දක්වෙන්නේ රට පුරා පවත්නා ළමා පෝෂණය මධ්‍යම ප්‍රමාණයේ සිට බෙහෙවින් හීන මන්දපෝෂණ තත්වය දක්වා සැලකියයුතු අන්දමේ වෙනස් මට්ටම්වලින් පවතින බවය. බොහෝ විට එයට

[16] ප්‍රතිචාරිකයාගේ නිර්නාමිකබව රැකගනුවස් නම වෙනස් කර ඇත.

හේතුව වශයෙන් දක්වෙන්නේ ගර්භනී මාතාවන්ගේ අඩු පෝෂණ මට්ටම්වල ප්‍රතිඵලයක් වශයෙන් බිහි වන බරින් අඩු දරුවන් ය. (ළමාරක්ෂක සංවිධානය, 2000). නැගෙනහිර පළාතේ සිදු වන අඩු බර දරු (එනම්, උපතේ දී බර කි.ග්‍රෑ. 2.5 ට අඩු දරුවන්) උපත් සංඛ්‍යාව 16.7% ක් වන ජාතික සාමාන්‍යය සමඟ සසඳන කල 26% කට ආසන්න බැව් වාර්තා වේ. බරින් අඩු දරුවන්ගේ ඉහළම ප්‍රතිශතය වන 30.5% වාර්තා වන්නේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙනි. ගැටුම් පවතින කාලයේ දී ප්‍රතිශක්තීකරණ වැඩපිළිවෙල සාර්ථක කරගනු පිණිස "මානුෂීය විරාමයක්" සැලසීමට දරූ ප්‍රයත්නයන් තිබුණ ද, 93% කට ආසන්න ජාතික සාමාන්‍යය සමඟ සසඳන කල නැගෙනහිර පළාතේ සම්පූර්ණයෙන් ප්‍රතිශක්තිකරණයට ලක් කරන ලද ළමුන්ගේ ප්‍රතිශතය වන්නේ ආසන්න වශයෙන් 73% ක් පමණි. (ජසදෙ 2004b)

ගැටුම තම සෞඛ්‍යය සහ පෝෂණය කෙරෙහි බලපාන විවිධ ආකාරයන් පිළිබඳ ව පර්යේෂණය සිදු කෙරෙන අතරවාරයේ දී ළමෝ කරුණු දක්වූහ. ප්‍රචණ්ඩත්වය සහ අස්ථාවරත්වය පැවති කාලවල දී කඩසාප්පු වසා තිබූ විට සහ ප්‍රවාහන පහසුකම් නොමැති වූ විට බෙහෙවින් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පවා ලබා ගැනීම ජනයාට දුෂ්කර විය. ළමුන් වැඩි පිරිසක් පැවසුවේ බොහෝ දිනවල තමන්ට උදයේ ආහාරවේල පාසලේදී හවුලේ භුක්ති විඳීමට සිදු වූ බවය.

> *"මගේ මව ගර්භනී කාලයේ දී ඇට කන්න ඇති තරමට කෑම නොලැබුණ නිසා මගෙ සහෝදරයො දෙන්නෙක් මන්දපෝෂණයෙන් පෙළුණ."*
>
> (ගැහැණු ළමයෙක්, වයස 16 කි; මුස්ලිම්)

ගැටුම් හේතුවෙන් සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීමට තිබූ අවස්ථාවන් ද සීමිත විය. ප්‍රචණ්ඩත්වය දරුණු ලෙස පැවති අවස්ථාවන්හි දී කුඩා රෝහල් සහ සෞඛ්‍ය මධ්‍යස්ථාන බොහොමයක් වසා දමා තිබූ අතර, ක්‍රියාත්මක ව පැවතියේ වඩා යහපත් ආරක්ෂාවක් සලසා තිබූ මහ රෝහල් පමණකි. මේවා සාමාන්‍යයෙන් පිහිටා තිබුණේ විශාල නගරවල වන හෙයින් සීමිත ප්‍රවාහන සේවාවන් හේතුවෙන් මුදල් අපහසුකම්වලින් පෙළුණු අයට ඒවා කරා යෑමට සැලසී තිබුණේ මඳ අවකාශයකි. ගැටුම පවතින කාලවල තමන් අසනීප වූ විට වෛද්‍ය සේවාවන් සපයන්නෙකු වෙත යෑමට හෝ අවශ්‍ය ඖෂධ ලබා ගැනීමට හෝ නොහැකි වූ අවස්ථා පිළිබඳ ව ළමුන් කිහිප දෙනෙක් ම පැවසූහ.

> *"මට ඇදුම තියනවා. කරදර තිබුණ කාලෙ මට රෑට ඇදුම හැදුන වෙලාවලට මගෙ දෙමාපියන්ට මාව ඉක්මනට රෝහලට අරන් යන්න පුලුවන්කමක් තිබුණෙ නෑ. අපිට අපේ ම කියලා වාහනයක් තිබුණෙ නෑ. ඒ වගේ ම මාව අම්පාරට ගෙනියන්න වාහනයක් කුලියට ගන්න පුලුවන්කමකුත් තිබුණෙ නැත්තෙ වෑන් අයිතිකාරයොත්, ඩ්‍රයිවරලත් රෑට එලවන්න බය වුන හින්දයි. ඒ හින්දා මට සිද්ද වුනේ කලින් වතාවක රෝහලෙන් දීලා ඉතුරු වෙලා තිබුණ පෙති වගයක් අරන්, බේත් තෙල් ටිකක් ගාලා දරා ගෙන ඉන්නයි. අපිට රෝහල් යන්න පුලුවන් වුනේ උදේ එළිය වැටුනට පස්සෙයි."*
>
> (ගැහැණු ළමයෙක්, වයස 16 කි; සිංහල)

> *"මොනවා හරි ප්‍රශ්නයක් ඇති වුනාම අපි ආණ්ඩුවෙ රෝහලට යන්නෙ නැත්තෙ ඒක තියෙන්නෙ ගමේ ඉඳලා හුඟක් දුර හින්දයි. ඒ නිසා අපි සල්ලි ගෙවලා පුද්ගලික සායනවලින් බේත් ගන්නවා. බාගෙ වෙලාවට රෝහල්වල බේත් ඇත්තෙත් නැ."*
>
> (පිරිමි ළමයෙක්, වයස 21 කි; ද්‍රවිඩ)

## 4.4 ළමුන් සහ ඔවුන්ගේ ආධාරක පද්ධති

අධ්‍යයනයේ සමීක්ෂණය මගින් වයස අවු. 18 ට අඩු ළමුන් 841 ක් සිටින ගෘහවාසයන් 303 ක් ආවරණය කරන ලදී. මෙම මුලු සංඛ්‍යාවෙන් ළමුන් 599 ක් වයස 10 - 18 අතර වයසේ පසු වූ අය වූහ. එයට අමතර ව සමීක්ෂණය මගින් 19 - 25 අතර වියේ පසු වන යොවුන් වැඩිහිටියන් 280 දෙනෙකු ද ආවරණය කරනු ලැබිණ. මෙම ළමුන් වාසය කළ ගෘහවාසයන් අතුරින් බහුතරය (84%) පිරිමි ගෘහමූලිකයෙකු සහිත ව දෙමාපියන් දෙදෙනා ම සිටි ඒවා විය. ගැහැණු ගෘහමූලිකයන් සිටි නිවාස 70 අතුරින්, අඩකට වැඩි ගෘහවාස සංඛ්‍යාවක් එක් මාපිය ගෘහවාසයන් විය. (වගුව 4.4.1 බලන්න.)

**වගුව 4.4.1 ගෘහවාසයන්හි සංයුතිය**

| ගෘහවාසයේ වර්ගය | ගෘහවාස සංඛ්‍යාව | එකතුව % |
|---|---|---|
| **මාපිය දෙදෙනා ම සිටින (එකතුව)** | **254** | **83.8** |
| පිරිමි ගෘහමූලිකයන් සහිත | 224 | 73.9 |
| ගැහැණු ගෘහමූලිකයන් සහිත | 30 | 9.9 |
| **එක් මාපිය (එකතුව)** | **42** | **13.9** |
| පිරිමි ගෘහමූලිකයන් සහිත | 2 | 0.6 |
| ගැහැණු ගෘහමූලිකයන් සහිත | 40 | 13.2 |
| **ළමා ගෘහමූලිකයන් සහිත** | **1** | **0.3** |
| **වෙනත් ඥාති ගෘහමූලිකයන් සහිත** | **6** | **2.0** |

*මූලාශ්‍රය:* ක්ෂේත්‍ර දත්ත (ගෘහවාසයන් පිළිබඳ සමීක්ෂණය) 2004.

ගැහැණු ගෘහමූලිකයන් සිටින ගෘහවාසයන් සැලකිය යුතු සංඛ්‍යාවක් තිබීමේ හේතුව දරිද්‍රතාව සහ ගැටුමට අදාළ කරුණු යන දෙකට ම අදාළ ව දැක්විය හැක. නිදසුන් වශයෙන්, වැඩිහිටි පිරිමින් පෞද්ගලික ආරක්ෂාව පිළිබඳ හේතු මත ප්‍රදේශයෙන් සංක්‍රමණය වන අතර ඔවුන්ගෙන් ඇතැමෙක් ආබාධිත තත්වයට පත් ව සිටිම, අතුරුදහන් වීම හෝ ගැටුම නිසා මරණයට පත් වී තිබීම පිරිමි ගෘහමූලිකයන් නැතිවීමට තුඩු දුන් සෙසු හේතු විය හැක. ගෘහවාසයන් සෑහෙන සංඛ්‍යාවක මව මැද පෙරදිග රැකියාවේ නිරත ව සිටි අතර, තම පවුල සමඟ අඛණ්ඩ ව වාසය කළේ නැත. කෙසේ වුව ද, තම ගෘහවාසයන් එක් මාපිය නිවසක් හෝ පිරිමි ගෘහමූලිකත්වයෙන් යුත් එකක් වශයෙන් සඳහන් කළේ ළමුන් කිහිප දෙනෙකු විසින් පමණකි. මාපිය දෙදෙනා ම නොමැති වීමේ හේතුවෙන් ළමයෙකු විසින් ගෘහමූලිකත්වය දරූ වෙයැයි වාර්තාගත ගෘහවාසයක් ද සමීක්ෂණයේ අන්තර්ගත ය. මෙහි දී මාපිය දෙදෙනා ම මිය යෑම හේතුවෙන් එකී ගෘහවාසයේ මූලිකත්වය දරන ලද්දේ විසි හැවිදිරි ගැහැණු ළමයෙකු විසිනි. ඇය තම ගෘහවාසයේ විසුවේ තම බාල සොහොයුරා සහ සීයා ද නඩත්තු කරමිනි.

නැගෙනහිර පළාතේ තිබෙන ආර්ථික අවස්ථාවන්හි සීමිතභාවය හේතුවෙන් පවුලට ආරක්ෂාව සපයන්නන් සංක්‍රමණය වීම සුලභ සිද්ධියන් වූ අතර එය ළමුන් කෙරේ කිසියම් බලපෑමක් ඇති කරන්නක් විය. නැගෙනහිර පළාතෙහි පවුලේ සාමාජිකයන්ගේ සංක්‍රමණය කිහිපාකාරයකින් සිදු වේ. ද්‍රවිඩ ප්‍රජාව අතර සිදු වන සංක්‍රමණය ගැටුමේ ඍජු ප්‍රතිඵලයක් වශයෙන් වන්නක් විය හැක. විවිධ ක්‍රියාකාරීන් විසින් තමන් බලෙන් බඳවා ගැනීමට සහ තමන්ට හිරිහැර කිරීමට ඉඩ ඇතැයි යන බියෙන් සමහරු ආරක්ෂාව පතා රටේ වෙනත් ප්‍රදේශ කරා ඇදී යති. මෙම කාරණය මුල් කොට ප්‍රදේශයෙන් පිටතට හෝ විදේශයන්ට සංක්‍රමණය වීමට නැඹුරු වන්නේ ප්‍රධාන වශයෙන් පිරිමින් වන අතර මුස්ලිම් ජනයා අතර රැකියා අපේක්ෂාවෙන් මැද පෙරදිගට විශාල වශයෙන් සංක්‍රමණය වන්නේ ස්ත්‍රීන්ය. ගැටුම නිසා මෙන් ම දරිද්‍රතාව හේතුවෙන් ද සංක්‍රමණය වන අවස්ථා ජනවාර්ගික කණ්ඩායම් තුන අතරෙහි ම දැකිය හැක. ගැටුම හේතුවෙන් තම කුඹුරුවලට හෝ ධීවර බිම්වලට යා ගත නොහැකි ව තවදුරටත් ජීවන මාර්ගයක් නැතිව ගිය කල, බොහෝවිට ගෘහවාසයන්හි ප්‍රධාන ආදායම් උපදවන්නා වන පිරිමින් රැකියා අවස්ථා සොයා රටේ වෙනත් ප්‍රදේශ කරා සංක්‍රමණය වීමට ඉඩ තිබේ.

මෙම සංක්‍රමණික ප්‍රවණතාවලින් පැන නැගිය හැකි අතුරුඵල කිහිපයක් ඇත. පවුලේ පිරිමි සාමාජිකයන් සංක්‍රමණය වීමෙන් මව සහ ඇතැම්විට වැඩිමහල් ළමුන් මත අමතර බරක් පැටවේ. මෙහි ප්‍රතිඵලය වන්නේ පවුල අනාරක්ෂිත තත්වයට පත් වීමත්, කායික අතින් අවදානම්වලට මුහුණ පෑමට ඉඩ තිබීමත් ය. පිරිමි සාමාජිකයන් එවන මුදල ගෘහවාසය නඩත්තු කිරීමට බොහෝවිට ප්‍රමාණවත් නොවන හෙයින් වඩාත් වැඩිමහල් දරුවන්ට, එසේත් නැත්නම් මව්වරුන්ට ද කිසියම් ආර්ථික ක්‍රියාකාරකමක නියැලීමට සිදු වේ. මෙහි තවත් ප්‍රතිඵලයක් වන්නේ සංක්‍රමණය වන පිරිමින් සාමාන්‍යයෙන් බොහෝ අවස්ථාවන්හි තමන් විසින් නඩත්තු කිරීමට අපේක්ෂිත පවුලට අමතර වශයෙන් තමන් වැඩ කරන ස්ථානයන්හි දෙවන පවුලක් ද ඇති කර ගැනීමයි. මෙය එකවර පවුල් දෙකක් නඩත්තු කළ හැක්කේ කෙසේදයි යන්න පිළිබඳ ගැටළුවක් පැන නංවන අතර, ඉන් පවුල් දෙකෙහි ම ළමුන්ට බලපාන ප්‍රශ්න ඇති කෙරෙන පරිදි පවුල් තුළ ගැටුම් උද්ගත වීමට මං පෑදෙනු ඇත.

විශේෂයෙන් ම නැගෙනහිර පළාතේ මුස්ලිම් ප්‍රජාවට අදාළ ව බෙහෙවින් අවධානයට ලක්විය යුතු කරුණක් වන්නේ බහුල වශයෙන් ගෘහ සේවිකාවන් වශයෙන් සේවය කිරීම සඳහා මැද පෙරදිගට

සංක්‍රමණය වන මව්වරුන්ගේ ඉහළ ප්‍රතිශතයයි. මේ හේතුවෙන් ළමුන්ගේ රැකවරණය පියා වෙත පැවරේ. මෙම ළමුනට ලබා දෙන රැකවරණය බොහෝවිට කනස්සල්ල ඇති කරවන්නකි. පියා තම රැකවරණය යටතේ ළමුන් තබා ගැනීම වෙනුවට ඔවුන් නැන්දලා හෝ ආච්චිලා වැනි වෙනත් නෑදෑයන් වෙත පවරා අත පිසදා ගැනීමේ නැඹුරුවක් පවතී. තම බිරියන් නොමැති කල නැවත විවාහයක් කර ගෙන ''මුල්'' විවාහයේ දරුවන්ට ඉටු විය යුතු යුතුකම් පැහැර හැරිය පියවරු පිළිබඳ අවස්ථා ද තිබේ.

මෙම සෑම අවස්ථාවකදී ම දරුවන් අවදානමට පත් වන අතර ඔවුන්ට රැකවරණය සලසන වෙනත් අයට ඔවුන් අපයෝජනයට ලක් කිරීමට ඉන් ඉඩ සැලසේ. තම සෙසු සහෝදර සහෝදරියන්ගේ තත්වය උසස් කර ගැනීමට කටයුතු කිරීමේ අවශ්‍යතාව පිළිබඳ හැඟීමක් ළමුන් තුළ ද ඇති වේ.

*''මගේ මව්පියො දෙන්න ම මැද පෙරදිග ගියා. තාත්තා ගිය මාසෙ ආපහු ආවා. අම්මා අපෙ මාමාට සල්ලි එවලා තිබුණා. මගෙ අතට කෙළින් ම ලැබුණෙ ගිය වාරේ මුදල් විතරයි. අම්මා මාස තුනකට සැරයක් මුදල් එවනවා.''*

(පිරිමි ළමයෙක්, වයස 21 කි; දවිඩ)

මැද පෙරදිග රැකියාවන්ට බහුල වශයෙන් යන්නේ විවාහක ස්ත්‍රීන් බැව් දක්නට ලැබීම කැපීපෙනෙන කරුණකි. එක් ළමයෙකු සැල කළේ අවිවාහක කතුන් විදේශ රැකියාවල නිරත වීම ''සදාචාරාත්මක'' නොවන දෙයක් බවය.

*''මම වැඩ කරන්න රට යනවාට අපේ පවුලෙ අය එකඟ වුනේ නෑ. මැද පෙරදිග ගිය තරුණියන් බඳින්න පිරිමි උදවිය කැමති නෑ.''*

(ගැහැණු ළමයෙක්, වයස 19 කි; මුස්ලිම්)

කෙසේ වුව ද, ළමුන් සම්බන්ධයෙන් සලකන කල පවුලේ සාමාජිකයන් සංක්‍රමණය වීම ධනාත්මක දෙයක් වශයෙන් සංජානනය කෙරේ. මේ දක්වා කර ඇති සාකච්ඡාවෙන් දැක්වෙන්නේ ගැටුමෙහි ප්‍රතිඵලයක් වශයෙන් පැන නගින දිළිඳු බව බොහෝ ළමුන් සහ ගෘහවාසයන් කෙරේ බලපා ඇති බවත්, වෙනත් ස්ථානයක විසුව ද, රැකියාවක නිරත ගෘහවාසයේ සාමාජිකයෙකු තම ගෘහවාසය පීඩනයට පත් කරන දැඩි ගැටළු සමහරකට සෙත සලසන බවත්ය. විදේශ රැකියාවක නිරත තම මව එවන මුදලින් පාසල් පොත් සහ අනෙකුත් අවශ්‍ය දෑ මිල දී ගත් අයුරු ළමුන් කිහිප දෙනෙකු විසින් ම පවසන ලදී. ඇතැම් අවස්ථාවල දී තම නිවස ඉදි කර ගැනීමට හෝ පුළුල් කිරීමට ද පවුලට හැකි වූ අතර, සාමාන්‍යයෙන් ඔවුහු යහපත් ජීවන තත්වයන්ට හිමිකම් කියති.

*''අපෙ අම්මා මැද පෙරදිග ගිය හින්දා 2000 අවුරුද්දෙ අපිට මේ ගේ හදා ගන්න පුලුවන් වුණා. අම්මා දන් කුවේට්වල ඉඳලා අපිට නොකඩවා සල්ලි එවනවා. අපි ඒවා කෑමබීම, ඉගෙනීමේ කටයුතු, විදුලිය, විභාග ගාස්තු වගේ දේට වියදම් කරනවා.''*

(ගැහැණු ළමයෙක්, වයස 16 කි; දවිඩ)

රැකියා සොයා සංක්‍රමණය වීම යුද්ධයේ අහිතකර ප්‍රතිඵලවලින් ගොඩ ඒම පිණිස ගෘහවාසයන් දරන ප්‍රයත්නයේ එක් උපායමාර්ගයක් ලෙස පෙනී යයි. එසේ වුවත්, ළමුන් රැක බලා ගන්නන්, - විශේෂයෙන් ම ඔවුන්ගේ මව්වරුන් - නොසිටින කල්හි ගෙදරදොරේ තනි වන ළමුන්ගේ පැවැත්මට, ආරක්ෂාවට, වර්ධනයට සහ ශුභසිද්ධියට හානි පැමිණීම ඉඩ තිබෙන හෙයින් සමනය කරන ලද දරිද්‍රතාවෙන් ඇති වන ''වාසි'' සංක්‍රමණය නිසා ඇති වන ''අවාසි'' සමඟ එකට තබා කිරා බැලිය යුතු ව ඇත.

## 5. ළමුන් තුළ පිහිටි සංජානනයන්

මෙතෙක් කළ සාකච්ඡාවන්හි එල්ලය යොමු වී තිබුණේ ගැටුම ළමුන් කෙරෙහි බලපෑමක් ඇති කරන්නට ඇත්තේ කෙසේ ද යන්න පිළිබඳ වන නමුත් ගැටළුව එම ළමුන් විසින් දකින ආකාරයෙන් ම විමසා නොබැලුවහොත් මෙම අධ්‍යයනය සම්පූර්ණ වන්නේ නැත. මෙම කොටසින් අවධානය යොමු කෙරෙන්නේ යුද්ධය ළමුන්ට බලපා ඇත්තේ කෙසේ ද යන්නත්, රට සහ එහි අනාගතය ගැනත්, අවසාන වශයෙන් අනාගතය සම්බන්ධයෙන් ඔවුන් තුළ පවත්නා අභිලාෂයන් සහ අපේක්ෂාවන් ගැනත් ළමුන් තුළ ඇති සංජානනයන් පිළිබඳ ව විමසා බැලීමටය.

ගැටුම පිළිබඳ ව තමන් තුළ පවතින පෞද්ගලික අත්දැකීම් පසෙක ලා ළමුන් පොදුවේ එක් පිරිසක් වශයෙන් ඊට ඔබ්බෙන් සලකා බලා, තම අදහස් පළ කරන ලෙස ළමුන්ගෙන් ඉල්ලා සිටි කල ඔවුන් අතුරින් විශාල සංඛ්‍යාවක් සිය අවධානය යොමු කළේ අධ්‍යාපනය කඩා කප්පල් වීම, ගැටුම හේතුවෙන් පවුලේ සාමාජිකයන් අහිමි වී යෑම සහ ආදායම නැති වී යෑම පිළිබඳ වය. ළමුන් තනි කණ්ඩායමක් වශයෙන් ගැටුමේ බලපෑමට ලක් වූ ආකාරය පිළිබඳ එක් එක් ළමුන්ගේ සංජානනයන් බොහෝවිට පදනම් වී තිබුණේ ඔවුන්ගේ ම හෝ ඔවුන්ගේ මිතුරන්ගේ නැතහොත් අසල්වැසියන්ගේ අත්දැකීම් මතය.

> *"ළමුන් හුඟ දෙනෙකුට ඉගෙනීම නතර කර දාන්න සිද්ද වුනා වගේ ම සමහරුන්ට අවුරුදු ගණන් ඉගෙනීම මඟ හැරුණා. අවුරුදු ගණන් ඉගෙනීම නතර කරල ඉඳල ආපසු පාසලට ආ ළමයි හුඟ දෙනෙක් අපේ පන්තියෙ ඉන්නවා. ගැටුම විසේසයෙන් බලපෑවෙ පාසල් යන ළමුන්ටයි."*
>
> (ගැහැණු ළමයෙක්, වයස 18 යි; දුවිඩ)

> *"වැඩියෙන් ම බලපෑවේ ළමුන්ගේ අධ්‍යාපනයටයි. හුඟ දෙනෙක් කාලය ගත කළේ කැළේ නිසා ඉගෙනීම කර ගෙන යන්නත් බැරි වුණා. කන්න මුකුත් තිබුණෙත් නෑ."*
>
> (ගැහැණු ළමයෙක්, වයස 17 කි; සිංහල)

> *"මේ ගමේ සමහර ළමයි බාල කාලෙ ඉඳල ම රස්සාවල් කරන්න පටන් අරන්. හුඟක් ළමයි හාල් මෝල්වල වැඩ කරනවා."*
>
> (පිරිමි ළමයෙක්, වයස 24 කි; දුවිඩ)

ළමුන් තම එල්ලය යොමු කර තිබුණේ ස්වකීය ප්‍රදේශය හෝ තම වටපිටාව ගැන වන අතර, රටේ වෙනත් ප්‍රදේශයන්හි වසන ළමුන්ට ගැටුම බලපා ඇති ආකාරය ගැන ඔවුන්ගෙන් අදහසක් පළ නොවූ තරම් විය. කොටු වූ භූගෝලීය අවකාශයක වසමින් තම සීමිත අත්දැකීම් තුළින් තමා අවට දේ දකින ඔවුන් සතු ලෝකය පිළිබඳ දැක්ම පටු එකක් බව පෙනෙන්නට තිබුණි. මෑතක් වන තුරු ම ප්‍රදේශය තුළ ගමනාගමනය සහ සන්නිවේදනය බෙහෙවින් ම දුෂ්කර ව පැවති අතර, රටේ වෙනත් ප්‍රදේශයන් හෝ වෙනත් රටවල් පසෙක තිබිය දී, නැගෙනහිර පළාතේ අනෙකුත් ප්‍රදේශ පිළිබඳ ව පවා ළමුන් බොහෝ දෙනෙකු දැන සිටියේ මඳ වශයෙනි. තොරතුරු සම්බන්ධයෙන් පැවති මෙම ඇතැම් දැනුම් පරතරයන් නැති කරගත හැකි ව තිබූ මාර්ගය වූ අධ්‍යාපනය මෙම ළමුන්ට එම කාර්යය ඉටු කර දී තිබූ බවක් පෙනෙන්නට තිබුණේ නැත. අවබෝධතා ගිවිසුමට පෙර හෝ පසුව පැවති තත්වයන් සමඟ සසඳා බැලීමේ දී සියලු ම ප්‍රතිචාරකයන් පැවසුවේ ප්‍රවාහන සේවාවන්, අධ්‍යාපනය සහ සෞඛ්‍ය පහසුකම් යනාදියට වඩාත් පහසුවෙන් පිවිසීමට හැකි වන පරිදි තම ජීවන තත්වයන් වැඩිදියුණු වී ඇති බවය. ගමනාගමනයට තිබූ බාධාවන් ඉවත් කරලීම අවබෝධතා ගිවිසුමෙන් සැලසුන වැදගත් මෙහෙයක් බව බොහෝ අය සඳහන් කළහ.

> *"වැඩිදියුණුවක් දකින්න තියනවා. කිසි බාදාවක් නැතුව මම කැමති ඕනෑ තැනකට මට යන්න පුලුවන්."*
>
> (පිරිමි ළමයෙක්, වයස 23 කි; දුවිඩ)

> *"ඒ දවස්වල මුස්ලිම් අය අපේ ගමට ආවෙ නෑ. ඒ වුනත් ඒ අය CD මිල දී ගන්න දැන් අපේ සාප්පුවට එනවා. අපිට නියම ප්‍රවාහන සේවාවක් තිබුණෙ නෑ. ඒ වුනත් අවබෝධතා ගිවිසුමෙන් පස්සෙ අපිට ප්‍රවාහන ප්‍රශ්න නෑ. කිසි කරදරයක් නැතුව ළමයි පාසල් යනවා."*
>
> (පිරිමි ළමයෙක්, වයස 24 කි; දුවිඩ)

*"දැන් අපිට බයක් නැතුව ජීවත් වෙන්න පුළුවන්. දෙමළ ළමයි දැන් නිදහසේ පාසල් යනවා. අපිට අපි කැමති තැනක යන්න පුළුවන්. තව තවත් ප්‍රදේශවලට විදුලිය ලබා දීලා තියෙනවා. යුද්දය නැති නිසා දැන් අපිට බයක් නැතුව පාසල් යන්න පුළුවන්."*

(පිරිමි ළමයෙක්, වයස 16 කි; සිංහල)

අවබෝධතා ගිවිසුම පිළිබඳ ව ධනාත්මක ප්‍රතිචාර තිබුණ ද, රටේ දේශපාලන වාතාවරණය පිළිබඳවත්, සාමය පිළිබඳ අනාගත බලාපොරොත්තු පිළිබඳවත් ළමුන් තුළ වූයේ මඳ අපේක්ෂාසහගත භාවයකි. රටේ පවත්නා දේශපාලන තත්වය පිළිබඳ ව සියලු ම ළමුන් ප්‍රතිචාර දක්වූයේ නැත. "පිටස්තරයන්"[17] සමඟ මෙම ප්‍රශ්න ගැන සාකච්ඡා කිරීම ඇතැම්විට ළමුන් අපහසුතාවට පත් කරන්නක් වූ හෙයින් සමහර ළමුන්ට මෙම විෂය පිළිබඳ ව තම අදහස් පළ කිරීමේ හැකියාවක් නොමැති බව පෙනෙන්නට තිබුණි. උතුරේ සහ නැගෙනහිර සාමය පවත්වා ගෙන යෑම පිළිබඳවත්, ගැටුමට ස්ථිර විසඳුම් සෙවීමට දරන ප්‍රයත්නයන් පිළිබඳවත් ප්‍රතිචාර දක් වූ අය අතුරින් බොහෝ දෙනෙක් පළ කළේ අතෘප්තිමත් හැඟීමකි.

*"දේශපාලනය කියන්නෙ වැදගැම්මකට නැති දෙයක්. ඒක අනුන් රවටන මාර්ගයක්. ඒ වුනත් සාම කතා එක්තරා දුරකට සාර්ථකයි. අපි සාම සාකච්ඡා ශක්තිමත් කරන්න ඕන. සාම කතාවලටත්, සාකච්ඡාවලටත් බාදා පැමිණුනොත් රට විනාසෙට පත් වෙන්න පුළුවනි. සාම ක්‍රියාවලිය නිසා පළාතෙ කර්මාන්ත බොහොමයක් දියුණු වෙලා තියෙනවා. (. . .) සාමයට බාදා ඇති වුනොත් මේ සේරම දියුණුවන් ඇණ හිටීවි."*

(පිරිමි ළමයෙක්, වයස 16 කි; සිංහල)

*"අපිට ස්ථිර සාමයක් ඕන. මිනිසුන්ට නිදහසේ ජීවත්වෙන්න පුළුවන්කම තියෙන්න ඕන. මිනිසුන්ගෙ ප්‍රශ්න ගැන නිතර හොයා බලන ස්ථාවර හොඳ ආණ්ඩුවක් අපිට ඕන."*

(ගැහැණු ළමයෙක්, වයස 22 කි; මුස්ලිම්)

*"මම දේශපාලනයට කැමති නෑ. මම ඒ ගැන මුකුත් දන්නෙ නෑ."*

(ගැහැණු ළමයෙක්, වයස 19 කි; සිංහල)

දිගින් දිගට ම පවත්නා රැකියා අවස්ථා නොමැතිවීම සහ ප්‍රදේශයේ දියුණුවක් නොමැතිවීම ගැනත්, අනාරක්ෂිතභාවය වැඩිවෙමින් පැවතීම ගැනත් ළමෝ තම අදහස් පළ කළහ.

*"රටේ වගේ ම නැගෙනහිරත් ඉතා අවුල් සහගත තත්වයක් පවතින්නෙ. මම අද ගෙදර එන අතරෙදී පොලිසිය මාව සෝදිසි කරල, හුඟ වේලාවක් ප්‍රශ්න කළා. මම එල්ටීටීඊයෙ කෙනෙක් කියල සැක කරල ඒ අය මාව හිරේ දමාවි ද කියලා මම බය වුණා. එහෙම වුනා නම් මට වුනේ මොකද කියලා කවුරුත් දන්නෙ නෑ."*

(පිරිමි ළමයෙක්, වයස 21 කි; ද්‍රවිඩ)

ප්‍රදේශයේ එක දිගට පවත්නා ස්ථාවරත්වයත්, සාමයත් පිළිබඳ ව ඔවුන් තුළ සැකයක් පැවතුන ද, තම අනාගතය පිළිබඳ ව බොහෝ ළමුන් පසු වූයේ ධනාත්මක සිතිවිල්ලෙන් යුතු ව අපේක්ෂා සහගතවය. සමස්තයක් වශයෙන් ගත් කල, ඔවුන්ගේ අනාගත අපේක්ෂාවන් යොමු වී තිබුණේ තම අධ්‍යාපනය නිම කර, තම පවුලට උපකාරී වී, එහි ආදායම් මට්ටම ඉහළ නංවා ගැනීම පිණිස රැකියාවක් සොයා ගැනීම කෙරෙහි ය. රටේ සෙසු පළාත්වල යොවුන් ජනයා අතර දැකිය හැකි ප්‍රවණතාවක් වශයෙන් නිරීක්ෂණය කර ඇති ආකාරයට ම වැඩි මනාපයක් පවතින බව පැහැදිලි ව දිස් වූයේ රාජ්‍ය අංශයේ රැකියා කෙරෙහිය. (ඉබාගුවෙන්, 2005)

*"මට ඕනෙ වෛද්‍යවරයෙක් වෙන්නයි. මගේ ඉලක්කය ඒකයි. මට තව ඉගෙන ගන්න ඕනෙ. වෛද්‍යවරයෙක් වුනොත් මිනිසුන්ට සේවය කරන්න මට පුළුවනි."*

(ගැහැණු ළමයෙක්, වයස 16 කි; මුස්ලිම්)

---

17 අධ්‍යයනය සිදු කරගෙන යන අතරතුර 2004 වසරේ මුල් භාගයේ දී එල්ටීටීඊය තුළ ඇති වූ බෙදී යෑමක් හේතුවෙන් තත්වය සැලකිය යුතු ලෙස පිරිහී යෑමට පටන් ගත්තේ ය. කණ්ඩායම් දෙක අතර පැවති සටන් නිසා ආතතිය වර්ධනය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් "තොරතුරු" සොයා බැලීමේ යෙදී සිටින ජනයා කෙරෙහි අවිශ්වාසයක් පැන නැගුණි. ගුණාත්මක සම්මුඛ සාකච්ඡා පවත්වන අවස්ථාවේ දී ලබා ගන්නා තොරතුරු සන්නද්ධ කණ්ඩායම් අතට පත් කරතැයි යන බියෙන් එක් ගෙහිමියෙක් තම ගෘහවාසය පිළිබඳ ව සිතාමතාම ව්‍යාජ තොරතුරු සැපයීය.

> “මොකක් වුනත් මට කාරි නෑ. ආරක්ෂක නිලධාරියෙක් හැටියට වුනත් කමක් නෑ, මට ඕනෙ ආණ්ඩුවෙ රැකියාවක් කරන්නයි.” (පිරිමි ළමයෙක්, වයස 21 කි; ද්‍රවිඩ)

ආධුනිකත්වයන්හි හෝ රැකියාවන්හි දනටමත් නිරතව සිටි ළමුන්ට අවශ්‍ය වූයේ තම පවුලට උපකාර වීම සඳහා හෝ තම ව්‍යාපාර පුළුල් කර ගැනීම සඳහා හෝ තම තත්වය උසස් කර ගැනීමය. වැඩිදියුණු කරගත් දනුමින් යුතු වූ ඇතැම්හු මැද පෙරදිග රැකියා ලබා ගැනීමට පවා අපේක්ෂා කළහ.

> *“මට ඕනෙ ඉගෙන ගෙන හොඳ කාර්මික ශිල්පියෙක් වෙලා මැද පෙරදිග ගිහින් මගෙ පවුල නගා සිටුවන්න මුදල් උපයා ගන්නයි.”*
>
> (පිරිමි ළමයෙක්, වයස 19 කි; මුස්ලිම්)

මෙම පර්යේෂණයේ දී සම්මුඛ සාකච්ඡාවට භාජන කරන ලද ළමුන් විසින් ගැටුම මගින් ඔවුන් වෙත පටවා ඇති සීමිතභාවයන් ජය ගැනීම පිණිස සැලකිය යුතු මට්ටමේ සර්වශුභ දෘෂ්ටියක් සහ අධිෂ්ඨාන ශක්තියක් පිළිබිඹු කරන ලදී. ඔවුන්ගෙන් ඇතැමෙකු අධ්‍යාපනය දුටුවේ තම තත්වය විපර්යාසයට භාජන කිරීම පහසු කරවන සාධකයක් ලෙසිනි.

> *“මම ඉගෙන ගන්නවා. මේ පළාතෙ ජීවත් වෙන්න මම කැමති නෑ. මම සුදුසු රැකියාවක් සොයා ගෙන යුද්ධය ආයිත් පටන් ගත්තොත් වෙන පළාතකට යනවා. යුද්ධය නැති ඕනෑ ම පළාතක් මට කමක් නෑ.”*
>
> (ගැහැණු ළමයෙක්, වයස 16 කි; සිංහල)

ජනවාර්ගික ගැටුම නැවත ඇරඹෙතැ යි හෝ “වෙනත්” ගැටුමක් පැන නැගිය හැකියැයි යන බිය බොහෝ ළමුන් වෙතින් පළ වූ නමුදු, තමන් මෙම තත්වයන් වෙනසකට භාජන කිරීමට සමත් බලවේගයක් නොවෙතැයි යන්න ඔවුනට හැඟී ගොස් තිබිණ. තමන් ජීවත් වන දේශපාලන පරිසරයට බලපෑම් කිරීම අතින් තමන් පසුවන අසරණ තත්වය ගැන හැඟීමක් ළමුන් වැඩි දෙනෙකු තුළ විය. ඔවුන්ගේ අවධානය වඩාත් යොමු වී තිබුණේ ගැටුම හෝ දරිද්‍රතාව විසින් තමන් වෙත පටවන ලද දුෂ්කරතාවන් ජය ගැනීමට කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ ව වන අතර, ඔවුන්ගේ අපේක්ෂාවන් සහ ශක්තීන් එල්ලව තිබුණේ දිළිඳු බවින් ගොඩ ඒමට ප්‍රයත්න දැරීම කෙරෙහිය.

**කොටුව 3: “ඔවුන් අපට සියලු ම සැපපහසුකම් ලබා දෙනවා”**

කවිතා සහ ඇගේ මවත්, නැගනියත් වාසය කරන්නේ ලෑලි කිහිපයක් ගසා, පොල් අතු සෙවිලි කර අටවා ගත් කුඩා පැල්පතකය. ඔවුනට ජලය, විදුලිය හෝ වැසිකිලි පහසුකම් නොතිබූ අතර ඔවුන් භාවිත කළේ තම අසල්වැසියන් සතු එම පහසුකම්ය. පවුල දිවි ගැට ගසා ගත්තේ සිල්ලර කෑම ජාති සාද ඒවා පාසල් සිසුන්ට විකිණීමෙන් ලද සුළු ආදායමින් සහ කවිතාගේ විවාහක සහෝදර සහෝදරියන්ගෙන් ද ලද උදව් උපකාරවලිනි. එසේ වුවද, කවිතා ඉන් සෑහීමට පත් ව සිටි අතර, තම වැඩිමහල් සොහොයුරා තමන්ට අවශ්‍ය සියලු සැපපහසුකම් සලසන බව ඇය පැවසුවාය.

සම්මුඛ සාකච්ඡාවට සතියකට පෙර, තම මවට සිල්ලර කෑම අලෙවි කිරීමට උදව් වෙමින් සිටි කවිතාගේ මලනුවන් එල්ටීටීඊයට බැඳෙන්නට ගොස් සිටියේය. මෙම තීරණයෙන් කවිතාත්, ඇගේ මවත් කලබලයට පත් වූයේ ඔවුන් දිගටම ඉගෙනීමේ නිරත වීමෙන් අත්වන සෙත ගැන ඔහු සමඟ කතාබස් කර ඔහුට පැහැදිලි කර දී තිබූ නිසාය. ඔවුන් කඳවුරට ගොස් ආපසු යෑමට එන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටිය ද ඉන් පලක් වූයේ නැත.

තමා ඉදිරියේ නිමක් නැති ප්‍රශ්න තිබුණ නමුදු ධෛර්යවන්තියක වූ කවිතාට තමා ඉදිරි ජීවිතයේ දී කිරීමට යන දේ පිළිබඳ ව පැහැදිලි දර්ශනයක් තිබිණ.

තම වැඩිමහල් සොහොයුරියගෙන් ඉල්ලා ගත් සටහන් ආදිය ප්‍රයෝජනයට ගනිමින් ඇය උසස් පෙළ විභාගය සඳහා සූදානම් වෙමින් සිටි අතර, ඇය පැවසුවේ තමාට අවශ්‍ය වන්නේ ගුරුවරියක වී නිදහස් අධ්‍යාපනය ලබා දෙමින් තම ගම දියුණුවට පත් කිරීමට උපකාරී වීමට බවය.

## 6. නිගමනයන් සහ නිර්දේශයන්

මෙම අධ්‍යයනය සිදු කරන ලද්දේ ශ්‍රී ලංකාවේ පවතින සන්නද්ධ ගැටුම නිසා ළමුන් පීඩාවට පත් වන්නේ කෙසේදයි යන්න ගැන ඇති අවබෝධය තවදුරටත් පුළුල් කර ගැනීමේ අරමුණිනි. ගවේෂණාත්මක අධ්‍යයනයක් වශයෙන් සංකල්පගත කරන ලද මෙයට ඉලක්කගත වූයේ නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක තුනකි. මෙම වාර්තාව ප්‍රධාන වශයෙන් පදනම් වී ඇත්තේ ගෘහවාසයන් 303 ක් ආවරණය කරමින් සිදු කරන ලද ගෘහ කුටුම්භ සමීක්ෂණයෙන් සහ ළමුන් සමඟ පවත්වන ලද ගුණාත්මක ගැඹුරු සම්මුඛ සාකච්ඡාවන් 30 ක් ඇසුරින් එක් රැස් කර ගන්නා ලද තොරතුරු මතය.

සන්නද්ධ ගැටුම ළමුන් කෙරෙහි ඍජු සහ වක්‍ර ආකාරවලින් බලපා ඇති බැව් මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයෙන් සනාථ වේ. ළමුන් නිරත වන ප්‍රධාන ක්‍රියාකාරකම වශයෙන් අපේක්ෂිත අධ්‍යාපනයට ඉන් බලපෑමක් සිදු ව තිබේ. එබඳු අවස්ථාවන් යටතේ පාසල් හැර යතැයි අපේක්ෂිත ළමුන්ගේ සංඛ්‍යාව අපේක්ෂිත තරම් ඉහළ ගොස් නොතිබුණ ද, එය රටේ සෙසු ප්‍රදේශයන් සමඟ සසඳන කල ඒවාට වඩා අධික වූවකි. (යුද්ධයෙහි උච්ච අවස්ථාවෙහි ළමුන් වශයෙන් සිටි) යොවුන් වැඩිහිටියන් අතර අධ්‍යාපනය අකාලයේ අවසන් කිරීම වඩාත් ඉහළ මට්ටමකින් පැවතීමෙන් පෙනී යන්නේ ප්‍රචණ්ඩත්වයේ මට්ටම පාසල් ගමන නතර කිරීමේ ප්‍රවණතාව සමඟ ඈඳී තිබීම විදහා දක්වන බවය. රටේ සෙසු පෙදෙස් සමඟ සසඳන කල ගැටුම් පවතින ප්‍රදේශයන්හි ළමුන් පාසලට ඇතුළත් කිරීම සම්බන්ධයෙන් වෙනසක් දක්නට ලැබුණ ද, මෙම වෙනස සැලකිය යුතු අන්දමේ එකක් බව දක්වීමට තරම් සාධක මෙම අධ්‍යයනයෙහි දී හමු වූයේ නැත. එසේ වුව ද, මෙම ළමුන්ට ලැබී තිබූ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය අතින් සැලකිය යුතු විෂමතාවක් දක්නට තිබුණි.

ගැටුම් පැවති සමයන්හි දී ළමුන් පාසල්වලට විධිමත් පරිදි ඇතුළත් ව සිටිය ද, ඔවුන් පාසලට පැමිණීම පැවතියේ දුර්වල මට්ටමකින් වන අතර, ප්‍රචණ්ඩකාරී සිද්ධි නිසා ඇති වූ අනාරක්ෂිතභාවය හේතුවෙන් පාසල් පවත්වන දින බොහෝ ගණනක් අපතේ ගොස් ඇත. අනාරක්ෂිතභාවය සහ බිය නිසා ගුරුවරුන් ද පාසැලට නොපැමිණ තිබූ අතර, ඇතැම් අවස්ථාවන්හි දී සරණාගතයන්ට හෝ සන්නද්ධ හමුදාවලට හෝ නවාතැන් සැපයීම පිණිස පාසල් පවරා ගෙන තිබුණි. එයට අමතර වශයෙන්, බොහෝ පාසැල්වලට ප්‍රමාණවත් තරම් පහසුකම් නොමැති අතර ගැටුමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒවා නිසි පරිදි නඩත්තු කිරීමක් හෝ ඒවාට සම්පත් සැපයීමක් හෝ සිදු කර නොමැත. මෙම තත්වයන් යටතේ ළමුන් අධ්‍යාපනය ලබමින් පාසලේ ම රැඳී සිටීමට ප්‍රයත්න දැරුව ද, ඔවුන් ලබන අධ්‍යාපනය ගුණාත්මක වශයෙන් පහළ මට්ටමේ එකක් වීමට ඉඩ තිබේ.

ඇතැම් ළමුන් වේතන ලබන හෝ නොලබන ශ්‍රමිකයන් වශයෙන් වැඩ කිරීම පිණිස පාසල් හැර ගොස් තිබුණි. මෙම නිගමනය ඇතැම් අවස්ථාවල දී ගැටුමේ ප්‍රතිවිපාක සමඟ ඉතා ආසන්න ව බැඳී පැවතියේය. පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නා ඝාතනය කර තිබූ කල හෝ අංග විකලත්වයට පත් ව සිටි කල දරිද්‍රතාව නිසා ළමුන්ට පාසැල් ගමන දිගට ම කරගෙන යෑම අසීරු ව තිබූ අතර ඔවුන් කළේ පවුලේ ආදායමට අතිරේක ව යමක් එක් කිරීමට මං සොයා බැලීම පිණිස පාසල් ගමන නවතා දැමීමය. වැඩට ගිය බොහෝ ළමුන්ට සොයාගත හැකි වූයේ කටුක මෙන් ම අඩු පඩි ලැබෙන කුලී වැඩය. වඩාත් වැඩි වයසේ ළමුන්ට සහ යොවුන් වැඩිහිටියන්ට ලැබුණු රැකියා අවස්ථා ද යහපත් ඒවා නොවීය. නැගෙනහිර පළාතේ ආර්ථික ක්‍රියාකාරකම් නොමැතිවීම සහ රැකියා අවස්ථා සීමිත ව පැවතීම වැඩ කරන වැඩිහිටියන්ගේ මෙන් ම ළමුන්ගේ ද ආදායම් මාර්ග සීමිත වීමට තුඩු දී තිබුණි.

ගැටුම මඟින් දිළිඳු බවට පත් කිරීමේ තවත් ප්‍රතිඵලයක් ප්‍රදේශයේ සිදු වන සංක්‍රමණ රටාව තුළින් දැකගත හැකි විය. ගෘහවාසයන් ගණනාවක ම පවුලේ එක් සාමාජිකයෙකු බැගින් හෝ රැකියා සොයා ප්‍රදේශයෙන් බැහැරව සංක්‍රමණය වී තිබුණි. රැකියාවක නිරත පවුලේ සාමාජිකයෙකු සිටීමෙන් සාමාන්‍යයෙන් අදහස් වන්නේ ප්‍රමාණවත් ආහාර, ඇඳුම්පැළඳුම් සහ පාසල් අධ්‍යාපනය සඳහා අවශ්‍ය සම්පත් අතින් වඩාත් යහපත් ආකාරයේ ගුණාත්මක ජීවිතයක් වන නමුදු තම දෙමාපියන්, විශේෂයෙන් ම මව්වරුන් නිවසින් දුරස් ව සිටින කල බොහෝ ළමුන්ට නිසි රැකවරණයක් හෝ ආරක්ෂාවක් නොලැබී යයි.

තම සෞඛ්‍යයට සහ පෝෂණයට අදාළ ව ගැටුමින් ඇති වූ අහිතකර ප්‍රතිඵල පිළිබඳ ව ද වැඩි වයසේ ළමෝ සහ යොවුන් වැඩිහිටියන් සිය අදහස් පළ කළහ. ප්‍රචණ්ඩත්වය සහ අස්ථාවරත්වය ව්‍යාප්ත ව පැතිර ගොස් තිබූ කාලවල දී ඔවුනට ප්‍රමාණවත් තරම් ආහාර සහ වෙනත් අත්‍යවශ්‍ය දේ තම

ගෘහවාසයන්හි නොතිබෙන්නට ඉඩ තිබේ. ප්‍රවාහන පහසුකම් නොතිබුණ විට හෝ මාර්ගයේ ගමන් කිරීම ආරක්ෂා සහිත නොවූ විට, සෞඛ්‍ය සේවාවන් වෙත පිවිසීමට ද බාධා පැමිණේ.

සිදු වන දේ කෙරෙහි බලපෑම් කිරීමට තමන්ට බලයක් නැතැයි පෙනී ගිය කල, තමන් දුටු සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්හි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ ළමුන් අපහසුතාවකින් පසු වූයේ නැවත ගැටුමක් පැන නැගීමට ඉඩ ඇතැයි යන බියමුසු හැඟීම නිසාය. ගැටුම නැවත ඇරඹෙන්නේ නැත්නම් මිස, රට පිළිබඳ කිසියම් බලාපොරොත්තුවක් රඳවා තැබිය නොහැකි බව ඔවුනට හැඟී ගොස් තිබිණ. එසේ වුව ද, තමන් මුහුණ පෑ සියලු ගැහැටක් ම පසෙක තිබිය දී, මෙම අධ්‍යයනය සඳහා සම්මුඛ සාකච්ඡාවට භාජන කළ ළමුන් අතුරින් වැඩි පිරිස තුළ තම අනාගතය පිළිබඳ ව පැවතියේ ශුභවාදී දෘෂ්ටියකි. යුධ ගැටුම්වල හානිදායක ප්‍රතිවිපාකවලට - ප්‍රධාන වශයෙන් ම දරිද්‍රතාවට - ඔරොත්තු දීමට හැකි වන පරිදි ඔවුනට අවශ්‍ය වූයේ සුරක්ෂිත ආදායම් මාර්ග සෙවීමට ය.

මෙම අධ්‍යයනයෙන් පැන නගින නිගමනයන් කිහිපයක් ඇත :

- මරණය, ආබාධිත බව, පවුලේ සාමාජිකයන් අහිමි වීම සහ විස්ථාපනය වැනි ගැටුම ළමුන් කෙරෙහි ඍජු ව බලපෑ විවිධ ආකාරයන් තිබෙන අතර බොහෝ ළමුන්ට ගැටුම බලපා ඇත්තේ දරිද්‍රතාව මාර්ගයෙනි. ගැටුමේ ප්‍රතිඵලයක් වශයෙන් සෑම ගෘහවාසයක් ම පෙරට වඩා දිළිඳු තත්වයට ඇද වැටී තිබේ. දරිද්‍රතාව හේතුවෙන් ළමුන්ට පාසලේ රැඳී ඉගෙනුම ලැබීමට නොහැකි ව ඇති අතර, ඇතැම් අවස්ථාවන්හි දී ඔවුන්ගේ පවුල පත්ව සිටින තත්වය නිසා පවුලේ ආදායම් උපයන්නන් බවට පත් වීමට ද සිදු ව ඇත. මාර්ග, රෝහල් සහ පාසල් වැනි ප්‍රමාණවත් නොවන සහ බිඳ වැටුන යටිතල පහසුකම්වලින් යුත්, ගැටුම හේතුවෙන් පැන නැගුන ප්‍රදේශයේ දරිද්‍රතාව ළමුන්ගේ වර්ධනය සහ ශුභසිද්ධිය කෙරෙහි ද බලපා තිබේ.

- ඔවුනතර යම් යම් විෂමතාවන් පැවතුන ද, ජනවාර්ගික කණ්ඩායම් තුන සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය අතින් සලකන කල ද දිස්වන්නේ එක ම චිත්‍රයකි. ගැටුමේ ගැබ් ව ඇති දිළිඳුබවට ඇද දැමීමේ ලක්ෂණය මගින් ජනවාර්ගික කණ්ඩායම් තුන ම වඩාත් දිළිදු බවට පත් කර ඇත. අම්පාර දිස්ත්‍රික්කයේ වැසියන් - විශේෂයෙන් ම අම්පාර නගරයේ වැසියන් නැගෙනහිර පළාතේ ගැටුම් පවතින ප්‍රදේශයන්ට දුරින් වසන හෙයින් ගැටුම අඩුවෙන් ම බලපා ඇත්තේ ඔවුන්ට බව පෙනී යයි. එසේ වුව ද අධ්‍යාපනය, ළමා ශ්‍රමය, සෞඛ්‍යය සහ පෝෂණය යන අංශ අතින් ගැටුම පිරිමි සහ ගැහැණු ළමුන්ට එක හා සමාන ලෙස බලපා ඇති බව පෙනෙන්නට තිබේ.

- මෙම අධ්‍යයනයෙන් ආවරණය කර ඇති ළමුන් කණ්ඩායම් දෙක පිළිබඳ ව සසඳා බලන කල පෙනී යන කරුණක් වන්නේ ගැටුම උච්ච ලෙස පැවති කාලයේ දී ළමුන් වශයෙන් සිටි අය කෙරෙහි අවබෝධතා ගිවිසුම යටතේ මෙකල වසන ළමුන්ට වඩා තදින් ගැටුම බලපා තිබෙන බවය. තම ළමා අවධිය හැඩ ගැසෙමින් පවත්නා සමයේ වැඩි වයස් කාණ්ඩයේ පසු වූ ළමුන්, ප්‍රචණ්ඩත්වයේ සහ අනාරක්ෂිතභාවයේ ඉතා උග්‍ර අවස්ථාවන්ට නිරාවරණය වූ අතර ඔවුන් දිගින් දිගට ම ජීවත් වන්නේ භීතිය පිළිබඳ නිරන්තර හැඟීමකින් වෙළී ගෙනය. ගැටුම ඔවුන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපෑම් ඇති කළ අතර, ඔවුන්ගේ අධ්‍යාපනික ප්‍රාප්තියන් ගැටුමේ බලපෑම්වලට හසු නොවූයේ නම් ඊට වඩා ඉහළ මට්ටමකට පත් වන්නට ඉඩ තිබුණි. ඔවුනට මුහුණ පෑමට සිදු ව ඇති ගැටළුවලට මෙකල අලුතින් එක් වී ඇති තවත් ප්‍රශ්නයක් වන්නේ ඔවුන් රැකියාවක නියැලිය යුතු වයසට පත් වූ විට, නැගෙනහිර පළාතේ පවතින ආර්ථික ක්‍රියාකාරකම් සහ ඔවුනට ලබාගත හැකි රැකියා අවස්ථා අල්ප වීමය. බොහෝ අවස්ථාවන්හි දී ගැටුම මගින් පනවන ලද ඉමහත් දුෂ්කරතාවන් මැද අධ්‍යාපනයෙහි නිරත වීමෙන් පසු ඊට ඔවුනට ලැබෙන ත්‍යාගය ලෙස පෙනී යන්නේ විරැකියාව හෝ අඩු වේතන ලබන නුපුහුණු කුලී වැඩය.

- අවසන් වශයෙන් දක්විය යුත්තේ, ළමුන් අතර මෙන් ම වැඩිහිටියන් අතර ද ගැටුම නැවත ඇරඹේ යැයි යන ඉමහත් බියක් පවතින බවය. මෙම තත්වය පාලනය කිරීමට හෝ ඒ කෙරෙහි බලපෑමක් කිරීමට හෝ තමන්ට ශක්තියක් නොමැති බවට ඔව්හු හඟිති. ගැටුම් නොපවතින ප්‍රදේශයන්හි ජනයා තම ජීවිතය ගත කරන්නේ කෙසේදැයි යන්න පිළිබඳ හැඟීමක් ඔවුන් තුළ නොමැති හෙයින් ඔවුන්ගේ දැනුම සීමිත ව පවතින අතර ඉන් පිළිබිඹු වන්නේ උතුරේ සහ නැගෙනහිර පවත්නා ගැටුම මගින් ලෝකය පිළිබඳ ඔවුන්ගේ දැක්ම පටු කර ඇති ආකාරයයි. ගැටුම සහ ඒ තුළින් ඔවුන් ලද අත්දැකීම් තිබුණ ද, තම පවුල් සහ ප්‍රජාවන් මුහුණ පා සිටින ගැටළු ජය ගැනීමට ඔවුන් තුළ ඇති ඉමහත් අධිෂ්ඨාන ශක්තියත්, හැකියා පූර්ණභාවයත් ළමුන් වෙතින් පළ විය.

යුද්ධයේ බලපෑමට ලක් වූ ප්‍රදේශයන්හි වසන ළමුන්ට උපකාරී වීමේ අරමුණින් සැකසුන ප්‍රතිපත්ති සහ වැඩසටහන්වල අවධානය යොමු වන්නේ අධ්‍යාපනය, ළමා සෞඛ්‍යය සහ ළමා ශ්‍රමය වැනි ළමුන්ට විශේෂිත ගැටළු පිළිබඳව ය. මෙම ගැටළුවලට ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ කඩිනම් අවධානය යොමු වීම අවශ්‍ය කෙරෙන අතර මෙම පර්යේෂණයේ දී අනාවරණය වූ කරුණු මඟින් යෝජනා කෙරෙන්නේ නැගෙනහිර පළාතෙහි පැතිර පවත්නා දරිද්‍රතාවය ළමුන් කෙරෙහි පොදු වශයෙන් ද, එමෙන් ම ඔවුන්ගේ ගෘහවාසයන් කෙරෙහි වඩා විශේෂිත අයුරින් ද දැඩි ව බලපා ඇති හෙයින් එයට ද කඩිනම් අවධානය යොමු කිරීම අවශ්‍ය කෙරෙන බවය. ඒ අනුව මෙම වාර්තාවෙන් ප්‍රතිපත්ති නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කෙරේ.

1. ගැටුමෙන් පැන නැගුණු ප්‍රතිවිපාකවලට ඔරොත්තු දෙන ලෙස හැඩ ගැසීමට නැගෙනහිර පළාතේ ජනයාට දුෂ්කර වී ඇත්තේ ඔවුන් අතර පවත්නා දරිද්‍රතාව හේතුවෙනි. ගෘහවාසයන්හි ඇති දරිද්‍රතාවේ ප්‍රතිඵලය වන්නේ ළමුන්ගේ දරිද්‍රතාව වන අතර එය ළමුන්ගේ ශුභසිද්ධියට සහ වර්ධනයට හානිකර වූවකි. ළමුන්ගේ තත්ත්වය නංවා ලීම පිණිස මෙකල ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතට ඉක්මනින් ම අවශ්‍ය ව ඇත්තේ හුදෙක් ළමුන් ඉලක්කගත කර සිදු කරන මූලාරම්භයන්ට වඩා ගෘහවාසයන් සඳහා රැකියා සහ ආදායම් උපදවන අවස්ථා සැපයීම ඉලක්ක කරගත් සංවර්ධනයට අදාළ මැදිහත් වීම් ය. ක්ෂුද්‍ර-මූල්‍ය යෙදවුම් පිළිබඳ මූලාරම්භයන් සිදු කිරීමේ, කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායක සංවර්ධනයන් සඳහා ආධාර සැපයීමේ සහ නැගෙනහිර කෘෂි හා ධීවර අංශ නවීකරණය කිරීම සඳහා ආධාර සැපයීමේ අවශ්‍යතාවක් මෙන් ම ඉල්ලුමක් ද පවතී. එබඳු ආකාරයන්හි මැදිහත්වීම් මඟින් මේ දක්වා  සිදු කර නොමැති විවිධ අවස්ථාවන් බිහි කරලීම, මෙකල ළමුන් වශයෙන් පසු වන අය සඳහා මෙන් ම ගැටුම පවතින අවධියෙහි ළමුන් වශයෙන් පසු වූ අය සඳහා ද සෙතක් වනු ඇත.

2. මෙම ප්‍රදේශයන්හි යටිතල පහසුකම් සහ මහජන සේවාවන් ප්‍රතිසංවිධානය කිරීමේ සහ පුනරුත්ථාපනය කිරීමේ අවශ්‍යතාවක් ද පැන නැගී තිබේ. අබලන් ව ගිය මංමාවත් සහ නිසි පිළිවෙලකට නොමැති මහජන ප්‍රවාහන සේවාවන් වැනි දුර්වල ප්‍රවාහන පහසුකම් ආර්ථික ක්‍රියාකාරකම්වලට අවහිරතා පමුණුවා තිබේ. වාරිමාර්ග පද්ධති නිසියාකාර ව, නඩත්තු කර නොතිබීම හේතුවෙන් කෘෂිකාර්මික කටයුතුවලින්, විශේෂයෙන් ම වී වගාවෙන් උපරිම ඵල නෙළා ගැනීමට නොහැකි ව ඇත. මෙය රටේ අභ්‍යන්තර ප්‍රදේශයන්හි, විශේෂයෙන් ම තම ජීවනෝපාය උදෙසා වී ගොවිතැන මත ම රැඳී සිටින අම්පාර දිස්ත්‍රික්කය තුළ බැරෑරුම් සහගත තත්ත්වයක් උද්ගත කර තිබේ. දුර්වල යටිතල පහසුකම් සහ වෙළඳපලවලට පිවිසීමේ අපහසුව නිසා කෘෂි නිෂ්පාදන සඳහා ප්‍රමාණවත් වෙළඳපලවල් නොතිබීම ද ප්‍රදේශයේ සංවර්ධනය අඩාල කිරීමට හේතුවී ඇත. ගෘහවාස මට්ටමින් ආදායම් තත්වය ඉහළ නැංවීමේ මාර්ගයෙන් ප්‍රධාන වශයෙන් වක්‍ර ආකාරයෙන් ද, වඩා යහපත් ප්‍රවාහන සේවාවන් සහ යටිතල පහසුකම් සැපයීමේ මාර්ගයෙන් ඍජුව ද මෙම සංවර්ධන ක්‍රියාවලියන් ළමුන්ගේ අභිවෘද්ධියට උපකාරී වන්නේය. මින් ජලය වැනි සම්පත් කරා පිවිසීමට ඉඩ සැලසෙන අතර, ඒ අනුව පාසලට යෑමට ඒමට සහ ගෙදරදොරේ අවශ්‍යතාවන්ට වතුර ගෙන ඒමට ළමුන් වැය කරන කාලය සහ මහන්සිය බොහෝ දුරට අඩු වනු ඇත. එමඟින් ළමුන්ට තම අධ්‍යාපන කටයුතු සහ වෙනත් පුද්ගල සංවර්ධන කාර්යයන් සඳහා වැඩි වේලාවක් ගත කිරීමට හැකි වන අතර, ඔවුන්ට වඩා යහපත් සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වයන් අත් කර ගැනීමට ද ඉන් මග පෑදෙන්නේය.

3. නැගෙනහිර පළාතෙහි ළමුන්ට ලබා දෙන අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කළ යුතු ව ඇත. නගරවල පිහිටි විශාල විදුහල් එකක් හෝ දෙකක් හැරෙන්නට, ප්‍රමාණවත් නොවන ආචාර්ය මණ්ඩල සහ පුස්තකාල හා රසායනාගාර පහසුකම් හේතුවෙන් බොහෝ පාසල් අධ්‍යාපන ප්‍රාප්තිය අතින් දුර්වල මට්ටමකට පත් වී තිබේ. සම්පත් මඳවීම හේතුවෙන් බොහෝ පාසල්වල ඇත්තේ කලාවිෂය ධාරාවට පමණක් සීමිත අධ්‍යාපනයක් වන හෙයින් ළමුන්ට ගණිත විෂයයන් හෝ විද්‍යා විෂයයන් පිළිබඳ මූලික දැනුමක් ලබාගත නොහැකි ව ඇත. සාම්ප්‍රදායික දැනුමට පරිබාහිර රැකියා ලබා ගැනීම පිණිස ඔවුන්ගේ හැකියාවන් ඉහළ නැංවීමට ඇති ඉඩකඩ මේ හේතුවෙන් ඇහිරී ගොස් තිබේ. ප්‍රමාණවත් පුස්තකාල පහසුකම්  සහ තම ගමෙන් සහ ප්‍රජාවෙන් පරිබාහිර ලෝකය පිළිබඳ ව දැන ගැනීමට හැකි වෙනත් මාර්ග නොතිබීම, ජීවිතය කරා වෙනත් ආකාරයකින් එළඹීමට මෙම ළමුන්ට හැකි ව තිබූ  ලෝකය පිළිබඳ ඔවුන්ගේ දැක්ම සීමා කර ඇත. මෙම ගැටළුවලට විසඳුම් ලබා දීම පිණිස වඩාත් යහපත් ගුණාත්මක තත්ත්වයේ අධ්‍යාපනය සමඟ ඈඳුණු, ස්වකීය අධ්‍යාපන මට්ටමට සරිලන රැකියාවන් ලබා ගැනීම පහසු කරන වඩාත් පුළුල් අවස්ථාවන් සැලසීි තිබීම

අවශ්‍ය වන්නේය. එසේ නොමැති වුවහොත්, දැඩි දුෂ්කරතා මධ්‍යයේ පාසලේ රැඳී සිටින ළමුන් කරන්නේ හුදෙක් තම කාලය කා දැමීමක් පමණක් වන අතර, එය නුදුරේ දී හෝ පසු කාලෙක වඩාත් විශාල අස්ථාවරත්වයකට සහ ප්‍රදේශයේ නව ආකාරවලින් යුත් ගැටුම් උද්ගත වීමට මං පාදනු ඇත.


**අවසන් වදනක්. . .**

මෙම වාර්තාවේ පුන පුනා සඳහන් කර ඇති පරිදි ශ්‍රී ලංකාවේ නැගෙනහිර ප්‍රදේශයේ ගැටුම යළිත් පණ ගැන්වී ඒමේ ඉමහත් ඉඩක් පවතී. දේශපාලනය, දේශපාලනඥයන් සහ වත්මන් දේශපාලන තත්වය ගැන සෑම ජනවාර්ගික කොට්ඨාසයක් තුළ ම ඇත්තේ තමන් මෙකල මුලාවෙන් මිදී ඇතැයි යන එක හා සමාන හැඟීමකි. ප්‍රදේශයේ සංවර්ධනය සඳහා උතුරේ සහ නැගෙනහිර ගැටුමට එල්ටීටීඊය සමඟ ඇති කර ගන්නා දේශපාලන විසඳුමක් අත්‍යවශ්‍ය වුව ද, ඉන් නැගෙනහිර පවත්නා සියලු ප්‍රශ්න නොවිසඳෙන අතර, ප්‍රචණ්ඩකාරී ගැටුම් ඇති නොවීම ද, ඉන් සහතික නොකෙරේ. නැගෙනහිර පළාතේ සම්පත් පිළිබඳ උග්‍ර භියක් පවතින අතර, ප්‍රදේශයේ පවත්නා ගැටුම්කාරී වාතාවරණය ලිහිල් කරලීම පිණිස මෙම අඩුලුහුඩුකම් කෙරෙහි වහා අවධානය යොමු කරවිය යුතු ව තිබේ.

2004 දෙසැම්බර් 26 වන දින සුනාමියෙන් නැගෙනහිර මහත් විනාශයට පත් වුව ද, මෙම වාර්තාවේ ගැබ් වන අනාවරණයන් සහ නිර්දේශ අදට ද වලංගුව පවතී. ගැටුම හේතුවෙන් වසර 20 ක් මුළුල්ලේ දුක්ගැහැට විඳීමට ලක් ව සිටි ජනයා අමතක කර දමා, සුනාමියේ බලපෑමට කෙළින් ම හසු වූවන් කෙරෙහි පමණක් අවධානය යොමු කිරීමෙන් තව තවත් අලුත් ගැටුම්වලට මං පෑදීමට ඉඩ තිබේ. සුනාමියේ බලපෑමට හසු වූවන් හෝ වේවා, එසේ නැතහොත් ගැටුමේ බලපෑමට හසු වූවන් හෝ වේවා - කිසියම් විශේෂිත ප්‍රතිලාභීන් පිරිසක් ඉලක්ක කරගත් එකකට වඩා වෙනස් ආකාරයේ එකක් වන මෙම පුළුල් එළඹුම සංවර්ධනාත්මක මැදිහත්වීම්වලට හිතකර, ප්‍රදේශයේ අභිවෘද්ධිය සලසන එකක් වනු ඇතැයි තර්ක කෙරේ. සුනාමිය හේතුවෙන් ආධාර මෙන් ම ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානය ද නැගෙනහිර පළාතේ පෙදෙස් කරා ඇදී අවුත් ඇත. නැගෙනහිර පළාතේ පොදු සංවර්ධනය උදෙසා යටිතල පහසුකම් නැවත ගොඩ නගා, පුනරුත්ථාපනය කර, රැකියා නියුක්තිය සඳහා ප්‍රමාණවත් මං සැලසීමේ කටයුතු ක්‍රියාත්මක කරලීම මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර ඇති නිර්දේශ මඟින් වඩාත් පහසු වනු ඇත.

# ඇමිණුම්

# ඇමුණුම I: ශ්‍රී ලංකාවේ සිතියම




**විස්තර**

- උතුරු පළාත
- නැගෙනහිර පළාත
- උතුරුමැද පළාත
- වයඹ පළාත
- මධ්‍යම පළාත
- ඌව පළාත
- සබරගමු පළාත
- බස්නාහිර පළාත
- දකුණු පළාත

## ඇමිණුම II: සමීක්ෂණය සිදු කළ ගම්වල නම්

**අම්පාර දිස්ත්‍රික්කය**
අක්කරෙපත්තුව
අම්පාර නගරය
අට්ටලචේනෙ
අට්ටලපලම්
මධ්‍යම කඳවුර
චීනමගතුවරම්
කල්මුනේ
කල්මුනායිකුඩි
කරතිවු
ජයවර්ධනපුර
නින්දවූර්
පාලමුනෙ
සමන්තුරේ
තිරුක්කෝවිල්
තිර්යකර්නි
වෙහෙරගම

**මඩකලපුව දිස්ත්‍රික්කය**
චතුරුකොණ්ඩන්
චෙන්කලඩි
එරාවූර්
කාතන්කුඩි
කිරාන්
කොමාන්තුරේ
ඔට්ටමවඩි
පුන්ගුචමුනෙ
තන්ඩියාඩි
වාලච්චෙන

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**
අලස් ගාඩන්
අනදපුරි
ධීවරගම
ඉක්බාර් නගර්
ජමාලියා
කස්තුරි නගර්
කින්නියා
කුච්චවේලි
මුතූර්
රොටරිගම
වල්ලූර්
විල්ගම්විහාරය